**ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 සැප්තැම්බර් 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 සැප්තැම්බර් 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අනුරූපී වී නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **මෙම වාර්තාවේ ඡේදයට යොමුව** |
|---|---|
| මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ සටහන් කිරීමේදී වත්කම් ගිණුම් 11 ක එකතු වටිනාකම රු.803,781,970 ක් අඩුවෙන් හා වත්කම් ගිණුම් 2 ක එකතු වටිනාකම රු.15,974,595 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 1.6.1.4 දේපල පිරියත හා උපකරණ (අ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- | --- |
| 1.6.1 (අ) ආදායම් ලැබීම් | ආදායම් තැන්පත් ගිණුමේ රඳවාගනිමින් අනුමත අරමුණට පරිබාහිර කාර්යන් සඳහා තැන්පත් ගිණුම් භාවිතා නොකළ යුතුය. ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. මීට අදාල ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනයට ලක්කර අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1.1 (අ) ආදායම් ලැබීම් |
| 1.6.3 තැන්පතු ගිනුම් ශේෂ(අ) | දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යන් තුලින් රැස්කරන ආදායම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන එම ආදායම් එකතු කිරීමට විධිමත් පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු අතර එම ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. තැන්පත් කළ යුත්තේ ඒ සඳහා අනුමත ලැබීම් පමණක් වන අතර එහි ඇති මුදල් ඊට අදාල නිශ්චිත කාර්යන් සඳහා පමණක් වැය කල යුතුය. | 1.6.1.3 (අ) තැන්පතු |
| 1.6.3 තැන්පතු ගිණුම් ශේෂ (ආ) | දෙපාර්තමේන්තුව වෙත විවිධ කාර්යන් සඳහා ලැබෙන මුදල් පොදු තැන්පත් ගිණුමෙහි දිගුකාලීනව රඳවා තැබීමට කටයුතු නොකළ යුතු අතර එම මුදල් අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය. | 1.6.1.3 (ආ) තැන්පතු |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### 1.6.1.1 ආදායම් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාරිමාර්ග අභ්‍යාස ආයතන ගල්ගමුව විසින් සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් 10 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු. 6,420,681 ක මුදල රාජ්‍ය ආදායමට බැර කිරීමකින් තොරව තාවකාලිකව රඳවාගන්නා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | වාරිමාර්ග අභ්‍යාස ආයතන ගල්ගමුව විසින් සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා ලැබී තිබූ තැන්පතු 11 ක ඉතිරි වූ ශේෂය වන රු. 2,416,770 ක මුදල 2024 ජුලි 17 දින රජයේ ආදායමට බැර කරන ලදි. | සියලු ආදායම් වියදම් සඳහා යොදා නොගෙන රජයේ ආදායමට බැර කළ යුතුය. |

### 1.6.1.2 මූලධන වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි සහ ඉදිකිරීම්,ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය යටතේ එකතුව රු.මිලියන 6,684.95 ක් වැයකර තිබූ නමුත් මූල්‍ය නොවන වත්කම් අත්පත් කරගැනීම් ලෙස රු. මිලියන 3,305.19 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. එය දැරූ වියදමෙන් සියයට 51 ක් විය. | 2102 හා 2103 යන වැය විෂයන් යටතේ මිලදී ගත් සියළු වටිනාකම් CIGAS වැඩසටහනේ ඉන්වෙන්ට්‍රි ගත වන බැවින් මෙම වැය විෂයන් යටතේ දරන වියදම් කිසි විටකත් වත්කම් ලෙස ගිණුම් ගත නොකර සිටීමට හැකියාවක් නොමැත. එසේ වුවද ඇතැම් වත්කම් ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගත නොහැකි වටිනාකමින් අඩු අයිතම CIGAS ගිණුම් පද්ධතියේ වත්කම් වලින් ඉවත් කරනු ඇත. ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා දරන ලද රු. මිලියන 4.08 ක් 2024 ජූලි මස ගිණුම් ගත කර ඇති අතර ඉතිරි සියළු වියදම් 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනිත කර ඇත. 2105 වැය විෂය යටතේ මේ දක්වා දැරූ වියදම ප්‍රාග්ධනිත කර ඇති අතර වෙනත් දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන වල වියදම් ද අදාළ ව්‍යාපෘතිවල ප්‍රාග්ධනිත කර ඇත. මෙම වැය විෂයන් යටතේ දැරූ ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගත නොහැකි වියදම් අවස්ථා වලදී එම වියදම් පමණක් ව්‍යාපෘති වටිනාකමින් ඉවත් කර ඇත. 2506 වැය විෂයන් rehabilitation වැය විෂයන් යටතේ දරණු ලැබූ ප්‍රාග්ධනිත කළ යුතු වත්කම් විශේෂයෙන් ව්‍යාපෘති සඳහා දරනු ලැබූ වියදම් ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරනු ලැබුවේ 2023 වර්ෂයේදීය. ඒ අනුව මේ දක්වා දරනු ලබන සියළු ප්‍රාග්ධනිත කල යුතු වටිනාකම් 2024 වර්ෂය තුළ ප්‍රාග්ධනිත කර අවසන් කරමි. | සියලුම මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | 2021, 2022 හා 2023 වර්ෂයන්හි දරන ලද රු. 16,207,758,072 ක් හා ඒ යටතේ සංවර්ධනය කරන ලද රු.7,596,399,292 ක දේපල පිරියත හා උපකරණ නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | සඳහන්කර ඇති වර්ෂ වලදී මිලදී ගත් සියළු වටිනාකම් ස්ථාවර වත්කම් ලෙස CIGAS ගිණුම් පද්ධතිය මඟින් ගිණුම් ගත කර තිබේ. මෙම වැය විෂයන් යටතේ දරන වියදම් කිසි විටකත් වත්කම් ලෙස ගිණුම් ගත නොකර සිටීමට හැකියාවක් නොමැත. එසේ වුවද මෙම වැය විෂයන් යටතේ ලබා ගන්නා ඇතැම් වත්කම් ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගත නොහැකි වටිනාකමින් අඩු අයිතම CIGAS ගිණුම් පද්ධතියේ වත්කම් වලින් ඉවත් කරනු ඇත. විශේෂයෙන් ව්‍යාපෘති | සියලුම මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා දරනු ලැබූ වියදම් ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරනු ලැබුවේ 2023 වර්ෂයේදීය. ඒ අනුව මේ දක්වා දරනු ලබන සියළු ප්‍රාග්ධනිත කල යුතු වටිනාකම් 2024 වර්ෂය තුළ ප්‍රාග්ධනිත කර අවසන් කරමි. | |
| (ඇ) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වත්කම් සංකේත අංක 6141403 යටතේ වූ ජලාශ වටිනාකමට රු.280,751,890 ක් මාරුකිරීම් ලෙස එකතු කර ඇතත් එම වියදමට අදාල එක් එක් ජලාශ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 6141403 යටතේ වූ ජලාශයන්හි වටිනාකම රු.280,751,890 ක් මාරු කිරීම් ලෙස දක්වා ඇතත් නිවැරදි මාරු කිරීම් වටිනාකම රු. 18,638,660 කි. වර්ෂය තුළ මිලදී ගැනීම් වලින් රු.262,113,229 ක අගයක් භාණ්ඩාගාර මුද්‍රිත වල වැරදීමකින් මාරු කිරීම් ලෙස සටහන් වී තිබුණි. | ජලාශ වටිනාකම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර නිවැරදිව මාරු කිරීම් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ වෙනත් වැය ශීර්ෂවලින් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වැයකරන ලද රු. 516,729,324 ක මූලධන වියදම් නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වෙනත් වැය ශීෂයන් යටතේ වත්කම් අත්පත් කර ගැනීම් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව වෙත පවරා දී නොතිබුණි. ප්‍රතිපාදන ලබා දුන් එම ආයතන මෙම වත්කම් එම ආයතන සතු වත්කම් ලෙස ගිණුම් ගත කරනු ලැබුවේ නම් රජයේ වත්කම් ද්විගණනය වන බැවින් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවෙහි වත්කම් වශයෙන් හඳුනා ගත යුතු දැයි කරුණු පැහැදිලිව ඉදිරිපත් කරන ලෙස අදාළ අමාත්‍යාංශ වලට ලිපි යොමු කර ඇත. | දෙපාර්තමේන්තුව විසින් වෙනත් වැය ශීර්ෂ ප්‍රතිපාදනවලින් දරනු ලබන වියදම් නිශ්චිතව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වෙනත් ගණන්දීමේ නිළධාරින් වෙත ලබාදුන් ප්‍රතිපාදන වලින් එම ආයතන විසින් දරන ලද රු.20,878,750 ක මූලධන වියදම් නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙනත් දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන යටතේ එම ආයතන විසින් දරන ලද රු.20,878,750 ක වියදම 2024 වර්ෂයේ ජූලි මස ගිණුම් ගත කරන ලදී. | සියලුම මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

**1.6.1.3 දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ එකතුව රු.101,004,436,384 ක් ලෙස ගිණුම්ගත කර තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අවසාන ශේෂය රු.101,792,230,779 ක් විය. ඒ අනුව | දෙපාර්තමේන්තුව මඟින් සකසනු ලබන ස්ථාවර වත්කම් වාර්තාව අතර සෑම වර්ෂයකම නොගැලපීම් පවතී. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ CIGAS වැඩසටහනේ පවතින ගැටළු හේතුවෙන් මෙම වෙනස්කම් ඇති වී ඇත. දක්වා ඇති | භාණ්ඩාගාර ශේෂයන් සමඟ ඉකුත් වර්ෂ අවසන් හා ආරම්භක ශේෂ සන්දනාත්මකව පරීක්ෂා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක ශේෂ එකතුව රු.787,794,395 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම සියළු වියදම් වර්ෂය තුළ මිලදී ගැනීම් හා වර්ෂය තුළ ආරම්භක ශේෂ ලෙස ගලපන ලද අගයන් වේ. එම ආරම්භක ශේෂයන් හා ගැලපීම් වෙනස් වුවද වත්කම් වල අවසන් වටිනාකම දෙපාර්තමේන්තුවේ පොත් හා භාණ්ඩාගාර ශේෂයන් සමඟ තුලනය වේ. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 61111-61113 යටතේ ගොඩනැගිලි 583 ක වටිනාකම රු.2,469,052,703 ක් ලෙස ගිණුම්ගත කර ඇතත් වත්කම් කළමනාකරණ අංශය මගින් සකස්කර තිබූ වාර්තා අනුව ගොඩනැගිලි 2562 ක් දෙපාර්තමේන්තුව සතුව තිබුණි. ඒ අනුව ගොඩනැගිලි 1979 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට මේ දක්වා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරනු ලැබූ ගොඩනැගිලි 1500 ක පමණ ලේඛන කලාප කාර්යාල හා ප්‍රධාන කාර්යාලය මඟින් CIGAS ගිණුම් පද්ධතිය වෙත වාර්තා කර ඇතත් ගිණුම් තැබීමේදී එක් එක් ගොනු වල සඳහන් ගොඩනැගිලි වටිනාකම් එකතුව (Bulk Values) ගිණුම් තබා ඇති බව පෙනී යයි. මේ පිළිබඳව වෙන වෙනම පරීක්ෂා කර නිවැරදිව ගිණුම් තබා ඇති ගොඩනැගිලි ප්‍රමාණය ඉදිරියේදී වාර්තා කරමි. | සියළුම ගොඩනැගිලි තක්සේරු කර වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය මඟින් ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය වෙත පවරා දී තිබුණු ස්වයංක්‍රිය ජල මාපක හා වැසි මාපක 106 ක වටිනාකම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශයන්හී මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය මඟින් ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය වෙත ස්වයංක්‍රීය ජල මාපක හා වැසි මාපක 106 ක් පවරා දීමේදී, භාණ්ඩ භාර ගැනීම හා එහි වටිනාකම් සම්බන්ධ කිසිදු ලේඛණයක් අප අංශය වෙත ඉදිරිපත් කර නොතිබූ බැවින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත නොකරන ලදී. ව්‍යාපෘති මඟින් දෙපාර්තමේන්තුව වෙත වත්කම් ලබා දීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කරන ලෙස දන්වා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත. | විවිධ ව්‍යාපෘති යටතේ ලැබෙන වත්කම් නිවැරදිව පවරාගෙන ගිණුම් ගත කළ යුතුය. |

**1.6.1.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 11/1986 චක්‍රලේඛයේ 5 ඡේදයේ දැක්වෙන පරිදි වාරිමාර්ග 6 ආකෘතිය අනුව ක්ෂේත්‍ර බඩු සටහන් පොත් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ක්ෂේත්‍ර තොග පොත් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සඳහා කලාප හා ප්‍රාදේශීය කාර්යාලවල අදාල නිලධාරීන්ට IA/01/COM/03/2023 හා 2023 මැයි 04 දිනැතිව දැනුවත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්ෂේත්‍ර තොගපොත් පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ 1647(ඉ) අනුව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. වාහන 2004 ක් සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකපත් හා අදාළ ආදායම් බලපත්‍ර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය භාර නිලධාරියා විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද එම වාහන දැනට භාවිතාකරනු ලබන ස්ථානය හා භාරකාරීත්වය පැවරී ඇති නිලධාරියා සම්බන්ධ විස්තර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු වාහනවල ලියාපදිංචි සහතිකපත් පිළිබඳ විස්තර ලැයිස්තුගත කර ඇති අතර නිලධාරියාගෙන් නිලධාරියාට භාර දිමේදී ක්‍රමානුකූලව භාර දීමේ ක්‍රමවේදයක් මේ වන විට සකස් කර ඇත. මෙම කටයුතු ප්‍රධාන කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු හා ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු විසින් අධීක්ෂණය කරනු ලැබේ.<br>මේ වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දත්ත පද්ධති 03ක් පවත්වාගෙන යන අතර මෙම සියළු ක්‍රියාකාරකම් හා දත්තයන් ඇතුලත් එක් දත්ත පද්ධතියක් සහිත මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. | දෙපාර්තමේන්තුව සතු සියළු වාහන සම්බන්ධයෙන් වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුය. |

**1.6.1.5 විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුල 2105 සහ 2506 මූලධන වැය විෂයය 14 ක් සඳහා රු. 8,785,000,000 ක ප්‍රතිපාදන යටතේ රු.6,602,584,532 ක් වැයකර තිබූ අතර එම ව්‍යාපෘති ඇස්තමේන්තු යටතේ දැක්වෙන එක් එක් වැඩ අයිතම සඳහා වැයකර තිබූ වටිනාකම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුලත් වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | එක් ව්‍යාපෘති යටතේ දරනු ලබන වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි ගිණුම්ගත කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් පුද්ගලික සමාගමක් සමග 2017 ඔක්තෝබර් 13 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව අදාළ සමාගම විසින් 2021 ජනවාරි මස සිට 2022 දෙසැම්බර් මස දක්වා නිෂ්පාදනය කළ විදුලි ඒකක (kwh) 11,519.679 ලංකා විදුලි බල මණ්ඩලය වෙත විකිණීම මගින් උපයාගෙන තිබූ රු.200,934,154ක ආදායමෙන් ගිවිසුම අනුව සියයට 15 ක් හෙවත් රු.30,140,123 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබුණි. එයින් රු.6,085,051 ක් එනම් සියයට 20 ක් පමණක් අයකර තිබූ නමුත් ඉතිරි රු. 24,055,072 | රු.24,055,072 අයකර ගැනීමට කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | ආදායම් රැස්කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඒවා රැස්කර ගැනීමට කටයුතු කළයුතුය. |

නිසි පරිදි අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම හඳුනාගැනීමට අදාල ලේඛනද පවත්වා නොතිබුණි.

**2.2 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූලධන වියදම් වැය විෂය 02 ක් සඳහා වෙන්කරන ලද රු. 222,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. | සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022 ඔක්තොම්බර් 07 වන දිනැති ලිපියට අනුව ව්‍යාපෘතිය සඳහා දරන වියදම් විදේශ ණය (AFD) යටතේ පියවීමට එකඟ වීම සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුව ඇත. නමුත් මෙතෙක් තීරණයක් නොලැබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමට නොහැකි වී ඇත. | අයවැය සකස් කිරීමේදී අවශ්‍යතා හඳුනාගෙන හැකිතාක් දුරට විචලතා අවමවන පරිදි වියදම් ඇස්තමේන්තු කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වැය විෂයයන් 20 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.5,824,675,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් එකතුව රු.2,358,346,016 ක් හෙවත් සියයට 40 ක් ඉතිරි වී තිබුණි. | මොරාන,වෙල්ලස්ස, කුඩාවිලච්චිය හා ඇල්ලේ වැව හා යාන් ඔය යන ව්‍යාපෘති වෙනුවෙන් ඉඩම් අත්පත් කරගැනීමේ වන්දි වලින් කොටසක් පමණක් එම වර්ෂයේදී නිම කිරීමට හැකි වී ඇත. වන්දි ගෙවීමේ කාර්යය ආයතන කිහිපයක මැදිහත්වීමක් මත සිදුවන කාර්යයක් වන බැවින් සෑම අවස්ථාවකදීම සැළසුම් කළ පරිදි අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට නොහැක. | අයවැය සකස් කිරීමේදී අවශ්‍යතා හඳුනාගෙන වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම කළ යුතුය. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 16 කට අදාළව අවස්ථා 279 කදී රු.70,553,984 ක බැරකම් වලට එළඹ තිබුණි. | වර්ෂය අවසානයේ බැරකම් හා බැදීම් වලට එළඹීමේදී ප්‍රතිපාදන නිසි පරිදි තිබෙන බව තහවුරු කරගෙන බැදීම් වලට එළඹෙන ලෙස දන්වා 2023/12./13 දිනැතිව F/Cash book closing/2022 ලිපි මගින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 පරිදි කටයුතු කරන ලෙසට ලිඛිත උපදෙස් නිකුත් කර ඇත. | කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන යාමට කටයුතු නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යාන් ඔය ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාළව පස් කියුබ් 157,234 හා වැලි කියුබ් 81,905 හා කළු ගල් කියුබ් 201,784 ක් කැණීම් කිරීම සඳහා අයවිය යුතු රාජ්‍යභාග වශයෙන් රු. මිලියන 24 ක් හිඟව පවතින බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් දැනුම් දී තිබුණි. අදාළ හිඟ මුදල මූල්‍ය ප්‍රකාශනයන්හි බැරකමක් හෝ බැදීමක් ලෙස දක්වා නොතිබුණි. | යාන් ඔය ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාර දීමේදී ඊට අදාල ලිපි ගොනුවට අනුව කොන්ත්‍රාත්කරු විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කායාංශය වෙත රු. 30,681,926 මුදලක් ගෙවා ඇත. එම ලියකියවිලි වලට අනුව රු. 2,836,435 ක හිඟ මුදලක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කායාංශය වෙත ගෙවිය යුතුව ඇත. ගෙවීමට ඇති මුදල ලෙස රු. 38,044,762 ක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කායාංශයේ ලිපියට අනුව සඳහන්ව ඇත. කොන්ත්‍රාත්කරු මෙම මුදල් ගෙවුවද එම මුදල් ඔහු වෙත නැවත ප්‍රතිපූර්ණය කිරීමක් ද කර නොමැත. ඒ අනුව මෙම රාජ්‍යභාග බැරකමක් වශයෙන් සඳහන් කිරීම නිවැරදි වේ. | බැරකම් හා බැදීම් වෙන් වෙන්ව හඳුනාගෙන ලේඛන ගත කර ගිණුම් මගින් ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | උක්ත කරුණ සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 19 දින පැවති දෙපාර්තමේන්තු විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලදි. ඒ අනුව අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් සතිපතා පවත්වන රැස්වීම් වාර්තාවන් මත පදනම්ව අදාළ සහතික වීම සිදුකළ යුතු බවට තීරණය කරන ලදි 2023 පෙබරවාරි 15 දිනැතිව IA/01/COM/04/2022 යටතේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම මැයෙන් ලිපි නිකුත් කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 11 වැනි වගන්තිය | වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සංශෝධිත වාරිමාර්ග ආඥා පනතේ 110(4) වගන්තිය අනුව, වාරිමාර්ග විෂය භාර අමාත්‍යවරයාගේ ලේකම් විසින් අරමුදල පිළිබඳ වගකීම දැරිය යුතුය. එබැවින් සුදුසු පරිදි ලේකම්වරයා විසින් කටයුතු කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් ලේකම්වරයා දැනුවත් කරන ලදී. | වාරිමාර්ග සංශෝධන පනත ප්‍රකාරව වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XXIV වැනි පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති | මිය ගිය සේවකයන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,494,518 ක්, විශ්‍රාම ගිය සේවකයන් 122 දෙනෙකුගෙන් අයවිය යුතු රු.13,079,770 ක් සහ වැඩ තහනමට ලක් වූ, සේවය හැර ගිය හා සේවය අත්හිටවූ සේවකයන් 35 දෙනෙකුගෙන් අය විය යුතු රු.2,864,197 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුළ වර්ෂ තුනකට වඩා පැරණි රු. 3,280,334 ක ණය ශේෂ 32 ක් හා අවුරුදු පහකට වැඩි රු.2,047,790 ක ණය ශේෂ 33 ක් විය. | 2023දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ රජයට අයවීමට ඇති හිග හිටි ණය ශේෂයන්ගේ 2024 මැයි 31 දිනට ප්‍රගතිය ලෙස තැන්පත් ගිණුමේ ශේෂය ඉදිරිපත් කර ඇත. | ණය ආපසු නොගෙවූ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (ii) | XIX වැනි පරිච්ඡේදයේ 5.2.1 හා 5.3.1 වගන්ති | දෙපාර්තමේන්තුවට අයත් කලාප 14 ක පිහිටි නිළ නිවාස වල පදිංචි නිළධාරීන් හා සේවකයින්ගෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කරන ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇත. | නිල නිවාස වල පදිංචි නිලධාරීන්ගෙන් නිල නිවාස කුලී අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| (i) | මු.රෙ. 104-109 | 1984 සිට 2012 දක්වා අතර කාලයේ සිදුවී තිබුණු රු.18,292,188 ක හානි හා පාඩු 25 ක් සම්බන්ධයෙක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම කාලය තුල සිදු වී ඇති මෙතෙක් අවසන් නොකරන ලද අලාභ සිදුවීම් ගණන 09කි. ඒවා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කරමින් ඇත. | මුදල් රෙගුලාසි 104 සිට 109 දක්වා වූ නියමයන්ට අනුව හානි හා පාඩු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතුය. |
| (ii) | මු.රෙ. 136-139 | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මගින් කුලී පදනම මත යන්ත්‍ර ලබාගැනීමේදී, කම්කරුවන් සපයා ගැනීමේදී හා ගොවි සංවිධාන වෙත ගෙවීම් කිරීමේදී එම ආයතන වෙතින් ඉන්වොයිස් පතක් ලබා නොගෙන ඉංජිනේරු සහකාරවරයාගේ මැනුම් පොතෙහි පවත්නා මිනුම් පදනම් කර ගනිමින් ගෙවීම් කර තිබුණි. | මේ සම්බන්ධව 2023 පෙබරවාරි 15 දිනැති ලිපියෙන් ගිණුම් කටයුතු සම්බන්ධව උපදෙස් ලබාදී ඇත. | සැපයුම් කරුවන්ගෙන් ඉන්වොයිසි විධිමත්ව දෙපාර්තමේන්තුව ට ලබාගෙන ඒවා සහතික කිරීම, අනුමත කිරීම හා ගෙවීම සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (iii) | මු.රෙ. 571(2) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට වර්ෂ 2 ක කාලයක් ඉක්මවා තිබුණු රු.158,921,486 ක් වූ තැන්පත් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. එම තැන්පත් ශේෂය තුළ වර්ෂ 5 ක් ඉකුත් වූ රු. 7,071,727 ක තැන්පතු ඇතුළත් වී තිබුණි | පොදු තැන්පත් ගිණුමට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට කාලය වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු 165 ක රු.158,921,487 ක් පැවතිණි. එම තැන්පතු ශේෂය තුළ වූ කාලය වර්ෂ 02 ත් 05 ත් අතර තැනපතු වන රු. 151,849,759 ක තැන්පතු අතරින් රු 24,233,784 ක මුදලක් 2024 මැයි 31 දිනට නිරවුල් කර ඇත. එමෙන්ම කාලය වර්ෂ 5 ඉක්ම වූ තැන්පතු ශේෂය වන රු.7,071,728 අතරින් රු. 165,000.00 ක් 2024 මැයි 31 දිනට නිරවුල් කර ඇති අතර ඉතිරි තැන්පතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවති. | වර්ෂ 2 ක කාලයක් ඉක්මවා තිබූ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට ගත යුතුය. |
| (iv) | මු.රෙ.753(1) සහ (2) | විවිධ ව්‍යාපෘතින් යටතේ වැව්/ ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සියළුම කළාප කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරමි. | ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවල නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මු.රෙ. 756 | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල මෙහෙයුම් හා නඩත්තු වැඩ සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා නිකුත්කර ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් භෞතිකව පරීක්ෂා කර නොතිබුණි. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FIN/ST/VR/2023 හා 2023 නොවැම්බර් 24 දිනැති ලිපිය මඟින් අවශ්‍ය උපදෙස් හා ආකෘති පත්‍ර අදාල සියළුම නිලධාරින් වෙත ලබා දී ඇත. දෙපාර්තමේන්තුවට අයත් වැඩබිම්වල ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය ශේෂයෙන් භෞතික පරීක්ෂා කිරීමෙන් පසු කොට්ඨාශ සහකාර සහ වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් ලබාදෙන වාර්තාව, සමීක්ෂණ මණ්ඩලය විසින් තහවුරු කොට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට ඇතුලත් කරනු ලබයි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු උපදෙස් හා ආකෘති පත්‍ර අනුගමනය කර සිදුකල යුතුය. |
| (ඈ) | 2017 ජුනි 26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන තොරතුරු පද්ධතිය නිවැරදි ලෙස හා යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. | මිලදී ගැනීම් හා අපහරණය කරන වත්කම් ලේඛන ගත කිරීම සම්බන්ධ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාල උපදෙස් අනුව මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සහ තොරතුරු වාර්තා කිරීමට වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 06/2023 මඟින් හඳුන්වා දී ඇති මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) යටතේ කටයුතු කළ යුතු බව දැනුම් දී ඇත. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තු තොරතුරු පද්ධතිය නිවැරදිව යාවත්කාලීන කළ යුතුය. |
| (ඉ) | 2022 පෙබරවාරි 07 දිනැති අංක 1/2022 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 4වන ඡේදය | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ ව්‍යාපෘති සඳහා සාකච්ඡා කල යුතු කරුණු වැඩි ප්‍රමාණයක් වූ බැවින් 2024 මාර්තු 13 දින ව්‍යාපෘති සඳහා වෙනම ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීමක් පැවැත්වූ බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ඊ) | 1982 අංක 23 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (අ) ඡේදය | ඉංජිනේරු සහකාරවරුන් විසින් ඊලග මාසයේ වැඩකරන දින 5 ක් ඇතුළත මාසික ද්‍රව්‍ය වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දිනට පෙර ද්‍රව්‍ය වාර්තා ලබා දීමට කටයුතු කරන ලෙස IA/01/COM/03/2023 හා 2023 මැයි 04 දිනැති ලිපිය මගින් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අනුව මාසික ද්‍රව්‍ය වාර්තා ලබාගත යුතුය. |
| (උ) | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 පෙබරවාරි 28 දිනැති අංක 03/2023 දරණ වාරිමාර්ග චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම කාර්ය මණ්ඩලය සඳහා රාජකාරි පැවරීම වෙනුවෙන් රැකියා විස්තරයක් සකස්කිරීම කල යුතු වුවත් සියළුම කාර්ය මණ්ඩලය වෙනුවෙන් එවැනි රැකියා විස්තරයක් සකස්කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සියළුම කාර්ය මණ්ඩලය සඳහා රාජකාරි පැවරීම වෙනුවෙන් රැකියා විස්තරයක් සකස් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 පෙබරවාරි 28 දිනැති අංක 04/2023 දරන වාරිමාර්ග චක්‍රලේඛය 04 ඡේදය | ක්ෂේත්‍ර නිළධාරින් තම රාජකාරි කටයුතු කිරීම සඳහා විධිමත් මාසික ඉදිරි වැඩ සටහන් පූර්ව මාසයේ 25 වැනි දින හෝ එදිනට පෙර තම ආසන්න ප්‍රධානියා වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවට අනුයුක්ත ඉංජිනේරු සහකාරවරුන් තාක්ෂණික සහයකයින් විසින් ක්‍ෂෙත්‍ර රාජකාරි වලට අදාල ඉදිරි දින වැඩසටහන් සකස්කර නොතිබුණද, ඒ පිළිබඳ නොසලකා එම නිලධාරින් හට ක්ෂේත්‍ර රාජකාරී කිරීමට අවසර දී තිබුණි. | අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ක්ෂේත්‍ර නිළධාරින් විධිමත් මාසික ඉදිරි වැඩසටහන් ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතුය. |
| (එ) | ක්ෂේත්‍ර ගිණුම් තැබීම සහ මිල කිරීම සම්බන්ධ විධිවිධාන සංග්‍රහය -ii කාණ්ඩය වාහන හා උපකරණ | | | |
| (i) | 21 ඡේදය | දෛනික ධාවන සටහන් අනුව කල වැඩ ගැන මාසපතා සාරංශය ඊලග මාසයේ 10 වෙනි දිනට පෙර යන්ත්‍රෝපකරණ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත්කළ යුතු වුවද 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ දෛනික ධාවන සටහන් ඉදිරිපත් කල යුතු වාහන 559 න් වාහන 243ක දෛනික ධාවන සටහන් නිසි පරිදි ඉදිරිපත් කර නොතිබුණි. | එම වාර්ථාවේ පිටපත් කාලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත යොමු කර අදාල නියමිත දිනට නොලැබුනු වාර්තා යන්ත්‍ර හා යාන්ත්‍රික අංශය වෙත ගෙන්වා ගැනීමට මේ වන විට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුව ධාවන සටහන් ඉදිරිපත්කළ යුතුය. |
| (ii) | 24 සහ 25 ඡේද | මාසික පිරිවැය වාර්තා ඊලග මාසයේ 20 දිනට පෙර යන්ත්‍රෝපකරණ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව සතු යන්ත්‍රෝපකරණ 482 න් | එම වාර්ථාවේ පිටපත් කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත යොමු කර අදාල නියමිත දිනට නොලැබුණු වාර්තා යන්ත්‍ර හා යාන්ත්‍රික අංශය වෙත ගෙන්වා ගැනීමට මේ වන විට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි වල ප්‍රකාරව මාසික පිරිවැය වාර්තා ඉදිරිපත්කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යන්ත්‍රෝපකරණ 210 ක මාසික පිරිවැය වාර්තා නිසි පරිදි ඉදිරිපත් කර නොතිබුණි. | | |

2.6 **තැන්පත් ශේෂයන්**

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් ගංගා ඇලදොල ආශ්‍රිතව කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම, වැලි ඉවත් කිරීම ඇතුළු වෙනත් ආර්ථික කටයුතු සඳහා බලපත්‍ර ලබා දීම හා විවිධ රාජ්‍ය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.10,000 බැගින් වූ ගාස්තු ලෙස අයකල රු. 8,925,901 ක ශේෂයක් අංක 6000-0-0-13-0-36-0-0 දරන ගිණුමට තැන්පත් කර විධිමත් අධිකාරි බලයකින් තොරව වියදම් දරා තිබූ අතර මු.රෙ 569 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ අදාළ කාර්යයන් තුළින් එක්රැස් කළ ආදායම් හා දරන ලද වියදම් පිළිබඳ නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ගිණුම් තැබීමද කර නොතිබුණි. | 2023 ජුනි මසට පෙර වැලි කැණීම් සඳහා නිර්දේශ ලබා දීමේ දී අය කරනු ලබන රු. 10,000 ක ගාස්තුව දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල මගින් අයකර ගැනීම සිදු කර ඇති අතර එම මුදල පරිපාලන වියදම් වශයෙන් ලබා දෙන බැවින්, අදාළ එම කාර්ය සඳහා ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරුන් වෙත නිදහස් කරනු ලබයි. 2023 ජුනි මස සිට වැලි කැණීම් සඳහා පරිපාලන වියදම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අය කරගෙන චෙක්පතකින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදෙන අතර එම මුදල් නිර්දේශ ලබා දුන් කලාප කාර්යාල වෙත නිකුත් කරනු ලබයි. කුඩා ජල විදුලි බලාගාර සඳහා නිර්දේශ ලබාදීමට රු.50,000 ක මුදලක් අයකරනු ලබන අතර ඉන් රු.15,000 ක මුදලක් රාජ්‍යභාගය ලෙස ගෙවීම් කර ඉතිරි මුදල කුඩා විදුලි බලාගාර සඳහා නිර්දේශ ලබාදීමට කලාප කාර්යාලයේ සහ ප්‍රධාන කර්යාලයේ පරිපාලන වියදම් ලෙස යොදා ගනු ලබයි. | විවිධ කාර්යන් තුළින් රැස්කරන ආදායම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන එම ආදායම් එකතු කිරීමට විධිමත් පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | උක්ත තැන්පතු ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.389,040,899 ක් වූ අතර, ඉන් ඇතැම් තැන්පතු අදාළ කාර්ය සඳහා යොදවා නොගෙන 2020 වර්ෂයේ සිට රඳවාගෙන තිබුණි. | රු.367,448,359 ක් අතරින් රු.100,268,832 ක මුදලක් 2023 මැයි 31 දිනට නිරවුල් කර ඉතිරි තැන්පතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවති. | විවිධ කාර්යන් සඳහා ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය. |
| (ඇ) | අංක 6000 -0-0-13-0-36-0-0 දරන තැන්පතු ගිණුමේ තෙවන පාර්ශවයන්ට අදාළ තැන්පතු පමණක් ඇතුළත් විය යුතු වුවද, තෙවන පාර්ශවයන් නොවන තැන්පතු 40 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට රු. 292,518,772 ක ශේෂයක් පැවතුණි. වාරිමාර්ග අමාත්‍යාංශ හා වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ වෙන්කළ ප්‍රතිපාදනවලින් නියමිත කාර්යයන් ඉටු නොකර වියදම් ලෙස ගිණුම්ගත කර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | තෙවන පාර්ශවයන්ට අදාළ තැන්පතු 6000-0-0-13-0-36 ගිණුමේ රඳවා ගැනීම සිදු කර ඇත. අදාළ ව්‍යාපෘතිවලින් තැන්පතු මුදල් නිදහස් කරන මෙන් ඉල්ලීම් කර නොමැති බැවින් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | තැන්පතු දිගුකාලීනව රඳවා ගෙන අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකළ චීන සමාගම විසින් මාතර නිල්වලා වේලි ව්‍යාපෘතියේ BR-5 බැම්ම 2003 වර්ෂයේ හානි වී තිබීම නිසා මාතර කිරලකැලේ ප්‍රදේශයට ඇතිවී තිබූ ගංවතුර අවදානම පාලනය කිරිම සඳහා ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට ව්‍යාපෘති කාර්යන් වෙනුවෙන් ලබාදී තිබූ රු. 21,364,992 ක මුදලින් රු.1,120,415 ක් පමණක් වැයකර 2023 දෙසැම්බර් 31 දිනට රු.20,244,577 ක ශේෂයක් අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | චීන සමාගම විසින් අදාල ව්‍යාපෘති වලට සාමාජීය හා පාරිසරික බාධාවන් හේතු කොට ගෙන ඉදිරි කටයුතු කරගෙන යාමට අපොහොසත් වී ඇත. එසේම, මේ වනවිට ප්‍රධාන කාර්යාලයේ සැලසුම් අංශය මගින් නැවතත් වෙනස් සැලසුමකට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. දැනට පවතින බැම්මේ මට්ටම මුහුදු මට්ටමේ සිට 2.7m ක් වන අතර එය, මුහුදු මට්ටමේ සිට 3.9m ක් දක්වා එසවීමට සැලසුම් කර ඇති අතර මේ වනවිට ඒ සඳහා ඇස්තමේන්තු සැකසෙමින් පවතී. | ව්‍යාපෘති මගින් පවරන විවිධ කාර්යයන් සඳහා ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය. |
| (ඉ) | දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී හම්බන්තොට කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාරි නිර්මිතයන්ට සිදුවූ හානි යථා තත්ත්වයට පත්කිරීම සඳහා ලැබී තිබූ රු.22,768,500 ක් තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇතත් එම වාරි නිර්මිතයන් යථා තත්ත්වයට පත්කිරීමට මේ වන තෙක් කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු වලින් සියයට 41 ක් ගෙවා රු.13,265,091 ක ශේෂයක් තැන්පත් ගිණුමේ තවදුරටත් පැවතුණි. | අදාල ව්‍යාපෘතියට ලද මුදලින් දැරීමට ඇති වියදම් අතර රු. 861,207 ක්වූ වවුචර් අක්මුදල් ලැබුණු පසු ගෙවා නිම කර ඉතිරි මුදල රජයේ ආදායමට බැර කිරීමටත්,සංශෝධිත ඇස්තමේන්තුව අනුව වර්ෂාව අවසන් වූ වහාම වැඩ කටයුතු සිදුකිරීමත් ඒ සඳහා රු. 5,221,476 ක බිල්පත් ලැබී ඇති අතර අක්මුදල් ලැබුණු පසු ගෙවීම් කරනු ලැබේ. මෙහි වැඩ කටයුතු සියයට 90 ක ප්‍රමාණයක් අවසන් කර ඇත. ගොවි සංවිධාන මගින් තවත් අත්‍යාවශ්‍ය වැඩ කොටසක් සිදු කර දෙන ලෙස ඉල්ලීම් කල බැවින් එම අනුමත වූ මුදලට හා ඇස්තමේන්තුවේ ඉතිරි මුදලින් එම කොටසද සිදු කිරීම සඳහා ප්‍රධාන ඇස්තමේන්තුව සංශෝධනය කර ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලැබුණු විගස අදාල ඉදිකිරීම් සිදු කරන බව වාරිමාර්ග අධ්‍යක්ෂ දන්වා ඇත. | ව්‍යාපෘති කාර්යයන් සඳහා ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය. |
| (ඊ) | බලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් අහුන්ගල්ල ගොවිජන සේවා බල ප්‍රදේශයේ හැගල්ල, කොස්ගොඩ පිහිටි පුරන් වූ කුඹුරු අක්කර 30 ක සෝජාන් ක්‍රමයට පහත් බිම්වල පොල් වගා කටයුතු කිරීම සහ වාරිපද්ධතියක් සකස් කරගැනීම වෙනුවෙන් පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් 2021 වර්ෂයේ නිදහස්කර තිබූ රු. 15,243,945 ක මුදල ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට ලැබී එම මුදල් අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබුණි. දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඍජු සම්බන්ධතාවයක් නොමැති මෙම කාර්ය විධිමත් අනුමැතියකින් තොරව ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් | දෙපාර්තමේන්තුව විසින් අක්කර 10 කට පමණක් ඇස්තමේන්තු සකස් කර පළමු අදියර යටතේ අක්කර 05 ක කොටසක වැඩ ආරම්භ කරන ලදි. ඒ අනුව අක්කර 10 සඳහා අනුඥාත ඇස්තමේන්තු මුදල රු. 4,202,000 ක් විය.මේ සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් රු.15,243,945 ක මුදලක් ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලබා දී තිබූ අතර මේ වනවිට රු.12,509,354 ක ශේෂයක් නිරවුල් නොවී පවතී. ව්‍යාපෘතිය සාමාජීය හා පාරිසරික බාධාවන් හේතු කොට තාවකාලිකව නතර වී තිබුණි. නව ඇස්තමේන්තු අනුමත කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය ආරම්භ කලද ඉඩම් ගැටළුවක් නිසා මෙම ව්‍යාපෘතිය ඉදිරියට පවත්වා ගෙන යාමට නොහැකි විය. එබැවින්, මෙම ව්‍යාපෘතිය ඉදිරියට පවත්වා ගෙන යාමට | ලැබෙන ප්‍රතිපාදන පොදු තැන්පත් ගිණුමෙහි දිගුකාලීනව රඳවා තැබීමට කටයුතු නොකළ යුතු අතර අදාළ කාර්යයන් සඳහා නොපමාව යොදවාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාරගෙන තිබුණි. උත්සව පැවැත්වීම, ඉන්ධන, ගමන් වියදම් ආදි විවිධ පරිපාලන වියදම් ලෙස රු.1,886,064 ක් වැයකර තිබූ අතර ඉතිරි රු. 12,509,354 ක මුදලක් මේ දක්වා අදාල කාර්ය සඳහා යොදවා නොගෙන උක්ත තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. ව්‍යාපෘතිය යටතේ අක්කර 5 ක් බිම් සකස්කර වගාකිරීම සඳහා රු. මිලියන 4.2 ක ඇස්තමේන්තුවක් අනුඥාත කොට කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා රු. 721,241 ක වැඩ සහතික කර ගෙවා තිබූ නමුත් ඉතිරි වැඩ කොටස් අතරමග නවතා දමා පාත්ති 5 ක් තුල පොල්පැල 125 පමණක් වගාකර තිබුණි. ඒ අනුව තවත් පොල්පැල 1,375 ක් සිටුවීම සඳහා පාත්ති 55 ක් සකස්කල යුතුව පැවතුණි. එසේම සම්පූර්ණ මුදල ගෙවා තිබුණද වර්තමානයේ වෙළඳපොල මිල උච්ඡාවචනය අනුව ඉතිරිවූ මුදලින් අදාල කාර්ය අපේක්ෂිත පරිදි නිමකිරීමට නොහැකිවී තිබුණි. | පොල් වගා කිරීමේ මණ්ඩලයේ සෘජු මැදිහත් වීමක් තුළින් ඉඩම් ගැටළුව නිරාකරණය කරන ලෙසත් නොඑසේ නම් පොදු තැන්පතුවේ පවතින මුදල් ආපසු ගැනීමට කටයුතු කරන ලෙසත් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත දන්වා ඇත. | |

## 2.7 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ, අත්තනගල්ල හා මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩයේ සභාපතිවරයා සහ චීන සමාගමක සභාපතිවරයා අතර 2013 මැයි 15 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඇ.ඩො.මිලියන 229.5 ක වටිනාකමකින් යුත් ව්‍යාපෘතිය 2014 – 2017 කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2016 මාර්තු 22 දින හා 2019 ජුනි මස 12 යන දිනයන්හි අවබෝධතා ගිවිසුම් 2 කට එළඹ තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රධාන ජල මූලාශ්‍රය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ වගකීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරගෙන තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | උක්ත ව්‍යාපෘතිය සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මගින් ඉදිරිපත්කල නිරීක්ෂණ සඳහා | ව්‍යාපෘතියට අදාලව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇතත් මේ සම්බන්ධයෙන් විශේෂ කැබිනට් අනුමැතියක් ගෙන නොතිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව සිදුකල එම වරද හඳුනා ගත් අවස්ථාවේ සිට එය | අවබෝධතා ගිවිසුම් වලට එළඹීමට පෙර ශක්‍යතා අධ්‍යනය සඳහා අමාත්‍ය මණ්ඩල |

| | | | |
|---|---|---|---|
| | විගණකාධිපති විසින් ලබාදී තිබූ නිර්දේශ මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එහිදී ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළයුතු බවට වූ නිර්දේශ 5ක්, 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 38(1) වගන්තිය ප්‍රකාර නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතු බවට වූ නිර්දේශ 2ක්, කොන්ත්‍රාත් පරිපාලනය ශක්තිමත් කළ යුතු බවට වූ නිර්දේශ 4ක්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අතිරේක පිරිවැය හා කාලය වැය නොවන ආකාරයට සිදු කළ යුතු බවට වූ නිර්දේශයක් සහ අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ගත යුතු බවට වූ නිර්දේශයක් සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව අත්තිකාරම් මුදල් ගෙවීමේදී රු. 50,811,416 ක් අමතරව ගෙවා තිබූ අතර එම මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී (Interim payment) එම මුදලින් රු. 40,223,654 මුදලක් අඩු කර ගෙන ඉතිරි මුදල වන රු.10,587,862 ඉතිරි ගෙවීම් කටයුතු වලදී අඩු කර ගැනීමට කටයුතු කරනු ලැබේ. තාක්ෂණික ඇගයීම් කමිටුවෙහි සේවය කළ සාමාජිකයන් සම්බන්ධයෙන් සොයා බලා සුදුසු කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. අවබෝධතා ගිවිසුමට (MOU) එළඹ තිබූ 2016 මාර්තු 12 දින වන විට ඒකාබද්ධව ජල සම්පාදන ව්‍යාපෘතිය නිමකිරීමට වර්ෂයකට අඩු කාලයක් පමණක් ඉතිරිව පැවති අතර එම කාල සීමාව තුල ජල මූලාශ්‍රයේ ඉදිකිරීම් කටයුතු නිමකිරීම ප්‍රායෝගික නොවන බව අවධානය යොමුකර නොතිබුණි. | අනුමැතිය ලබා ගත යුතු අතර තාක්ෂණික ඇගයීම් කමිටු සමාජිකයින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන නොසලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර වැඩිපුර ගෙවූ මුදල නොපමාව අයකර යුතුය. |
| (ii) | කොන්ත්‍රාත්කරු විසින් 2022 පෙබරවාරි 05 දින ඉදිරිපත්කළ දින දීර්ඝ කිරීම සඳහා වූ ඉල්ලීම් ලිපිය මගින් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි යටතේ වන 2.1 උප වගන්තිය අනුව කොන්ත්‍රාත්කරුට වැඩ බිම වෙත ප්‍රවේශ වීමේ හැකියාව නොලැබීම මත කාල දීර්ඝයන් ඉල්ලා තිබූ අතර ගිවිසුමේ 20.1 උපවගන්තිය මගින් කාලය දීර්ඝ කිරීම සඳහා වූ අතිරේක පිරිවැය ඉල්ලා සිටීමේ හිමිකම් කොන්ත්‍රාත්කරු විසින් සඳහන් කර තිබුණි. | කමිටු වාර්තාවට අනුව ප්‍රමාද කාලය ගණනයට ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්, නිසි පරිදි නිසි කාලය තුල අදාල වැඩ බිම කොන්ත්‍රාත්කරුට භාර දීමට අපොහොසත් වීම, ප්‍රදේශයේ ජනතාවගේ විරෝධතා හා කොවිඩ් වසංගත තත්වය වැනි කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් තොර කරුණු නිසා කාලය දීර්ඝ කර ඇත. මෙම නොවැළැක්විය හැකි කරුණු සම්බන්ධයෙන් කමිටු වාර්තාවේ සටහනක් වී නොමැති බව පිළිගනිමි. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් මේ වන විට අමතර පිරිවැය දැරීම සම්බන්ධයෙන් දැනුම්දීමක් කර ඇත. | කොන්ත්‍රාත්කරු සමග ඇතිකරගත් ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iii) | දිගුකාලීන ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට දැරීමට සිදුවන අමතර පිරිවැය (ද්‍රව්‍ය ඉහලයෑම් වැනි) සඳහා වන්දි ඔහු විසින් කොන්ත්‍රාත් කාර්යසාධන කාල සීමාව තුල සවිස්තරාත්මකව ඉදිරිපත් කරන බව දන්වා තිබීම. | මෙම ගිවිසුමට අනුව මාස 18 ක් වැනි කෙටි කාලයක් තුල ලංකා මුදලින් ගෙවීම් කටයුතු කළ යුතුව තිබුණි. නමුත් රුපියල නොසිතූ අයුරින් අවප්‍රමාණය වීම, කොන්ත්‍රාත් කාලය අනපේක්ෂිත ලෙස දීර්ඝ වීම, මිල ගණන් ඉහල යාම බලාපොරොත්තු නොවූ තත්වයකි. මෙය ගිවිසුම් ගතවන අවස්ථාවේදී පැවති තත්වයට වඩා පැහැදිලි වෙනස් වාතාවරණයකි. | ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iv) | බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා චීන සමාගම සමග ඇතිකරගත් ගිවිසුම් කාලසටහන සංශෝධනයට 2023 ජනවාරි 15 | ප්‍රසම්පාදන අස්ථිරත්වයට කාලය දීර්ඝ කිරීමට අදාල පිරිවැය හෝ මිල විචලනයන් සඳහා වූ පිරිවැය පිළිබඳව | කාලය දීර්ඝ කිරීම හේතුවෙන් සිදුවන කාලය |

| | | | |
|---|---|---|---|
| | දින ඉදිරිපත්කර තිබූ අංක IR/2023/05 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් 2023 නොවැම්බර් 1 දින සිට මාස තුනක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අනුමැතිය අපේක්ෂා කර තිබූ අතර ඒ සඳහා මුදල් හා ආර්ථික ස්ථායිකරණ අමාත්‍යවරයා විසින් 2023 ජනවාරි 25 දින ඉදිරිපත්කර තිබූ නිරීක්ෂණයන් අනුව පියවර ගැනීමට යටත්ව 2023 ජනවාරි 30 දින අනුමැතිය ලබාදී තිබුණි. උක්ත නිරීක්ෂණ අනුව කාලය දීර්ඝ කිරීම හේතුවෙන් සිදුවන කාලය දීර්ඝ කිරීමේ පිරිවැය සහ මිල විචලනයන් සඳහා වූ පිරිවැය දැරීමට සිදු නොවන බව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තහවුරු කළයුතු වුවත් එවැනි තහවුරුවක් ලබාගෙන නොතිබුණි. ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ 2023 දෙසැම්බර් 04 දිනැති අංක ID/BRP/06/01 දරන ලිපිය මගින් දින 77 ක් කාලය දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලබාදී තිබුණි. | තහවුරුවක් මෙම අවස්ථාවේදී කළ නොහැකිව පැවතුණි. | දීර්ඝ කිරීමේ පිරිවැය සහ මිල විචලනයන් සඳහා වූ පිරිවැය දැරීමට සිදු නොවන බව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තහවුරු කළයුතුය. |
| (v) | ගිවිසුම් කාල සටහන සංශෝධනය කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යවරයා විසින් 2023 ජනවාරි 15 දින ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් දීර්ඝ කරන ලද කාලසීමාව තුල සියළු ඉදිකිරීම් නිම කර, ව්‍යාපෘතිය විධිමත්ව ඉදිකිරීම් සේවායෝජකයා වෙත භාරදීම යන කොන්දේසියට යටත්ව 2023 ඔක්තෝබර් 31 දිනට පෙර ජලාශයෙන් බස්නාගොඩ පානීය ජල ව්‍යාපෘතිය සඳහා ජලය නිකුත් කිරීමට අත්‍යාවශ්‍ය ඉදිකිරීම් නිම කිරීමටත්, 2023 නොවැම්බර් 1 දින සිට මාස 3 ක කාල සීමාව තුල ජලය නිකුත් කිරීමට බාධා නොවන පරිදි ඉතිරි සියළු වැඩ නිම කිරීමටත් ඉදිරිපත්කර තිබූ යෝජනාවට අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2024 ජනවාරි 31 දිනට ව්‍යාපාතියේ කටයුතු නිමකළ යුතුව පැවතියද ඒ වන විට සියයට 25 ක වැඩ කොටස් තවදුරටත් නිමකළ යුතුව පැවතුණි. | මේ සම්බන්ධයෙන් කාලය දීර්ඝ කිරීමක් 2024 ජුනි13 දක්වා ලබා ගෙන ඇත. මේ වන විට භෞතික ප්‍රගතිය සියයට 81 ක් වේ. | ව්‍යාපාතියේ කටයුතු නිමකර මහජනතාවට ප්‍රතිලාභ ලැබීමට සැලැස්විය යුතුය. |
| (vi) | 2023 ජනවාරි 30 දිනැති උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, EPC කොන්ත්‍රාත් ගිවිසුමේ මූලධර්මයන්ට පටහැනිව බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා චීන සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුමෙහි ඉදිකිරීම් සඳහා වන අමතර පිරිවැය ගෙවීමට අදාලව ගිවිසුමේ කොන්දේසි සංශෝධනය කිරීම සඳහා 2024 ජනවාරි 23 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර තිබුණි. එමගින් අතුරු බිල්පත් අංක 11 (IPC 11) සිට අංක 21 (IPC 21) දක්වා වූ ගෙවීම්වල ඇතුළත් මිල විචලනය (Price Variation) සඳහා රු. 1,085,860,158 ක් ගෙවීමට හා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන ජාතික ජල | මෙම ව්‍යාපෘතිය මාස 18ක් වැනි ඉතා කුඩා කාල සීමාවක් තුල වැඩ නිම කිරීමට අපේක්ෂා කිරීම හේතුවෙන් මූලික ගිවිසුමට අනුව මිල විචලනය සඳහා හිමිකමක් නොදෙන ලදී. තත්වය එසේ වුවද ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්, අයහපත් කාලගුණය වැනි නොවැළැක්විය හැකි හේතූන් නිසා මෙම ගිවිසුමේ කාලය දීර්ඝ කිරීමට විටින් විට සිදුව ඇත. ගිවිසුම් ගත කාලයට සාපේක්ෂව මේ වන විට රුපියල අවප්‍රමාණ වීම වැනි හේතු නිසා මිල විචල්‍යක් ලබා දෙන ලෙස කොන්ත්‍රාත් කරු විසින් ඉල්ලීම් කර ඇති අතර ඒ | 2023 ජනවාරි 30 දිනැති උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට සහ EPC කොන්ත්‍රාත් ගිවිසුමේ මූලධර්මයන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර භාණ්ඩාගාරයට කිසිදු අමතර බරක් |

| | | | |
|---|---|---|---|
| | සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව පවතීදැයි වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් සනාථ කර ගෙන නොතිබුණි. එහිදි අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර වාරිමාර්ග අමාත්‍යාංශය අදාල ආයතනවලින් අවශ්‍ය නිෂ්කාශන ලබා ගත යුතු බවට උපදෙස් දී ඇත. එපමණක් නොව, භාණ්ඩාගාරයට කිසිදු අමතර බරක් පැටවීමකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය අරමුදල් සපයා ගත යුතු බවට නිර්දේශ කර තිබුණි. | අනුව ඉදිරි කටයුතු කර ඇත. මෙම ජල ව්‍යාපෘතියේ මූලික ගිවිසුමට අනුව එය ඇ. ඩොලර් වලින් ගෙවීම් කළ යුතුය. ඒ අනුව මෙම උප කොන්ත්‍රාත්තුව සඳහාද මුදල් අදාල ඇ. ඩොලර් වලින් වෙන් වී තිබිය යුතුය. මිල විචලනයන් ගණනය කිරීමේදී මෙම වෙන් කරන ලද ප්‍රමාණයෙන් වැඩි වන අමතර රුපියල් ප්‍රමාණය පැවතිය යුතුය. ඒ අනුව භාණ්ඩාගාරයට අමතර බරක් දැරීමට සිදු නොවිය යුතුය. කෙසේ වුවද මෙම කරුණ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ඇත. | පැටවීමකින් තොරව අරමුදල් සපයා ගත යුතුය. |
| (vii) | එහිදි අමාත්‍ය මණ්ඩලය විසින් පෙන්වාදී ඇති උපදෙස් ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇති තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ අනුව කටයුතු නොකර, මු.රෙ 40,72, 94(1) හි දැක්වෙන විධිවිධාන නොසලකා මිල විචලනයන් ගෙවීමට හැකිවන පරිදි මූලික කොන්ත්‍රාත් ගිවිසුමේ iv වන කොටසේ 13.8 වගන්තිය අනුව මිල විචලනයන් ගෙවීම් නොකරන බවට වූ කොන්දේසිය, සංශෝධනය කර 2024 අප්‍රේල් 16 දිනැති සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුම 2 අත්සන් කර තිබුණි. ඒ අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 47 ක් හෙවත් රු.1,085,860,158 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබූ අතර මේ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එකඟතාවය ලැබී නොතිබුණි.ඒ අනුව රු.1,085,860,158 ක් ගෙවීමේ වගකීම වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැවරී තිබුණි. | ජාතික ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කර ඇත. ඔවුන්ගේ නියෝජිතයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. | භාණ්ඩාගාරයට කිසිදු අමතර බරක් පැටවීමකින් තොරව අරමුදල් සපයා ගත යුතුය. |
| (viii) | මූලික කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි (fidic –first edition 1999 EPC/Turnkey Project) අනුව ව්‍යාපෘතිය අවසන්කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු කොන්ත්‍රාත් රඳවුම් මුදල් නිදහස් කළ යුතු බවට වූ කොන්දේසිය සංශෝධනය කර 2024 ජනවාරි 31 දක්වා අයකර ඇති රඳවුම් මුදල් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට පෙර ගෙවීමට හැකිවන පරිදි 2024 අප්‍රේල් 16 දින සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ කටයුතු සියයට 25 ක් ඉතිරිව තිබියදී රු.104,667,237 ක රඳවුම් මුදල් කොන්ත්‍රාත්කරුට ලබාගැනීමට හැකියාව ලැබී තිබුණි. | මේ වන විට ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා කොන්ත්‍රාත්කරු මූල්‍යමය වශයෙන් අපහසුතාවට ලක්ව ඇති බව දන්වා එයට පිළියමක් ලෙස රඳවුම් මුදල් නිදහස් කර ගැනීමට ඉල්ලීම් කර ඇත. රඳවුම් මුදල් වෙනුවට බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීමට ඔහු විසින් එකඟතාවය පලකර ඇත. | අවසන් කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු කොන්ත්‍රාත් රඳවුම් මුදල් නිදහස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ix) | 2016 මාර්තු 21 දිනැති අවබෝධතා ගිවිසුමේ 11 වන වගන්තිය හා 2019 ජුනි 12 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුමේ D2 ඡේදය අනුව ජලාශයේ පහල නිම්නයේ පිහිටි මොරාණ හා කෙටවෙල වාරි ක්‍රමයන්හි ජලය අපතේයාම අවම කිරීම සඳහා එම වාරි පද්ධති වැඩිදියුණු කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත රු. මිලියන 100 ක් ලබා දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය එකඟතාවය ලබාදී තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | මේ දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ජල සම්පාදන මණ්ඩලයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී නොමැත | ජලය අපතේ යාම අවම කිරීම සඳහා නොපමාව වාරි පද්ධති වැඩිදියුණු කළ යුතුය. |
| (x) | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා වාරිමාර්ග අමාත්‍යාංශයට අනුයුක්ත නිළධාරින් නිදහස්කර තිබුණි. එසේ නිදහස්කල නිළධාරින් සඳහා ගෙවනු ලැබූ වැටුප් හා පොදුකාර්ය පිරිවැය 2019 ජුනි 12 දිනැති අවබෝධතා ගිවිසුමේ D 3 වගන්තිය යටතේ ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ගෙවනු ලබන සියයට 6 ක කොන්ත්‍රාත් පරිපාලන හා සුපරික්ෂණ පිරිවැයෙන් අයකර ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | බස්නාගොඩ පානීය ජලය සැපයීමේ ප්‍රධාන ව්‍යාපෘතිය විදෙස් ණය යටතේ ක්‍රියාත්මක වන්නකි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට බස්නාගොඩ ජලාශය ඉදි කිරීම් අධීක්ෂණ කිරීමෙන් බලාපොරොත්තු වනුයේ වියදම් අවම කර ගැනීමකි. එම අරමුණ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැනට පවතින නිලධාරීන් උපයෝගි කරගෙන ඉටු කිරීමට එම කාල වකවානුවේදී තීරණය වී ඇත. මෙම හේතුව නිසා මෙම කාර්යය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැනට කරගෙන යන ඉදි කිරීම් කාර්යන්හිදි උපයෝගී කර ගන්නා සියයට 6 ක් වූ පරිපාලන වියදම් ප්‍රමාණය ම මෙම කාර්යය සඳහාද වෙන් කර ඇත. මෙමගින් නිලධාරීන්ට වැටුප් ගෙවීම් කිරීමක් බලාපොරොත්තු නොවේ. 2024 ජූනි මස වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් බස්නාගොඩ ජලාශ ව්‍යාපෘති කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා මාසික වැටුප් හා දීමනා වල පිරිවැය රු. 18,960,818ක් විය. | දෙපාර්තමේන්තු හා වාරිමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදනයන්ගෙන් ගෙවනු ලැබූ වැටුප් හා පොදුකාර්ය පිරිවැය කොන්ත්‍රාත් පරිපාලන හා සුපරික්ෂණ පිරිවැයෙන් අයකර ඒකාබද්ධ අරමුදලට බැර කර යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සියඹලාන්ගමුව ඔයේ සිට මහගල්ගමුව වැව පෝෂිත ඇළ ඉදිකිරීමමේ ව්‍යාපෘතිය | | |
| (i) | සියඹලාන්ගමුව ඔයේ සිට මහගල්ගමුව වැව පෝෂිත ඇළ ඉදිකිරීමමේ මෙම ව්‍යාපෘතිය 2012-2014 කාළ සීමාව එනම් වසර 3 ක් තුල නිම කිරීමට අපේක්ෂා කර තිබූ අතර වසර 9 ක් ප්‍රමාදවී තිබුණද මේ දක්වා නිමකර නොතිබුණි. 2014-2023 කාළ සීමාව තුල ව්‍යාපෘතිය සඳහා | ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ඇත. මූලික ඇස්තමේන්තුව 2011 වර්ෂයේ එවකට පැවති මිල ගණන් යටතේ පිළියෙල කර ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2014 වර්ෂයේ ආරම්භ කර ඇත. 2014 වර්ෂය | මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුමත කරගෙන නිසි අධීක්ෂණයක් මත ව්‍යාපෘතිය |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 580 ක ප්‍රතිපාදන සලසා ඉන් රු.මිලියන 375 ක් හෙවත් සියයට 64 ක් පමණක් වැයකර තිබුණි. මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත නොකර කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් වරින් වර ඇස්තමේන්තු අනුමත කර සැලසුමකින් තොරව කිලෝමීටර් 14 ක් දිගට ඉදිකිරීමට යෝජනාකර තිබූ ඇල මාර්ගයේ තැනින් තැන කිලෝමීටර් 2 ක් පමණ කැණීම් කිරීම සඳහා උක්ත පිරිවැය දරා තිබූ නමුත් එක් කොටසක හෝ ඇලමාර්ග නිසිපරිදි සකස්කර නොතිබුණි. ඒ අනුව වැයකල රු.මිලියන 375 ක වියදමෙන් කිසිදු ප්‍රතිලාභයක් මේ දක්වා ජාතික ආර්ථිකයට එක්කර නොතිබුණි. | සිට 2023 වර්ෂය දක්වා කොටස් වශයෙන් ප්‍රතිපාදන ලැබීමෙන් එම කාර්යය කිරීමේදී මිල විචලනයන් කෙරෙහි අවධානය යොමු නොකිරීම මෙහි ප්‍රධාන අඩුපාඩුවකි. දැනට ඇස්තමේන්තුව සංශෝධනය කිරීම ආරම්භ කර ඇත.<br>පවතින මිල ගණන් යටතේ මෙම කාර්යය ඉටු කිරීමට ගොස් යෝජිත වැඩ අවසන් කිරීමට නොහැකි තත්වයකට පත්ව ඇත. | නිමකිරීමට අවධානය යොමුකල යුතුය. |
| (ii) | දෙපාර්තමේන්තුව ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා අනුඥාත කරනු ලැබූ ඇස්මේන්තු හා ඒ යටතේ ඉටුකර ලද කාර්යන් හා සහතික කළ වැඩ වටිනාකම නිසිපරිදි හඳුනාගැනීමට හැකිවන පරිදි ලිපිගොනු පවත්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ වැඩකටයුතු ඉටු වී ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | අනුඥාත කරනු ලැබූ කාර්යන් හා සහතික කළ වැඩ වටිනාකම හඳුනාගත හැකි පරිදි ලිපිගොනු පවත්වාගෙන යා යුතුය. |
| (iii) | උක්ත ව්‍යාපෘතියහි ශක්‍යතා අධ්‍යන වාර්ථා අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් පලුකඩවල අක්කර 800, මහගල්ගමුව අක්කර 400 ක් හා නව ඉඩම් අක්කර 200 ක් වශයෙන් අක්කර 1400 ක් සඳහා වාරි ජලය සැපයීම අරමුණු කර තිබුණද පරිදි වාරි ජලය සැපයීමට ඉඩම් මේ වනතෙක් හඳුනාගෙන හෝ නොතිබුණි. | ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් යෝජිත ප්‍රදේශ දක්වා ජලය සැපයීම කළ නොහැකිව ඇත. | ශක්‍යතා අධ්‍යන වාර්ථාව අනුව වාරි ඉඩම් හඳුනාගෙන ජලය සැපයීමට කටයුතු කළ යුතුය. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙගාවොට් 1.5 ක ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම. | | |
| (i) | දැදුරු ඔය ජලාශය ඉදිකිරීමට යටතේ ජල විදුලිබලාගාරය ඉදිකිරීම සඳහා රු.මිලියන 249 ක් වෙන්කර තිබුණි. එම මුල් පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීමේදි මෙගාවොට් 1.5 ක ජල විදුලි ජනන බලාගාරයක් ඉදිකිරීමට යෝජනා කර එම බලාගාරය ඉදිකිරීම සඳහා ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් හා සාධාරණ හේතු දැක්වීමකින් තොරව ජල විදුලිබලාගාරය සඳහා වූ ප්‍රතිපාදන රු.මිලියන 50 ක් ලෙස අඩුකර තිබුණි. | මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුව මෙම ඉදිකිරීම සඳහා රු. මිලියන 50ක ප්‍රතිපාදන වෙන් කර ඇත. එහෙත් විදුලි බලාගාරයක් ඉදිකිරීම හා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික නිලධාරීන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු නොවන බැවින් මෙම බලාගාරය ඉදිකිරීමට මෙම දෙපාර්තමේන්තුවට හැකියාවක් නොමැත. | ප්‍රමාණාත්මක විශ්ලේෂණයකින් තොරව එම ජල විදුලිබලාගාරය ඉදිකිරීම අත්හැරීම පිළිබඳ නැවත විමසා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පුද්ගලික සමාගමක් සමග 2017 ඔක්තෝබර් 13 දින අවබෝධතා ගිවිසුමට එලබීමේදී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය ලබා ගෙන නොතිබුණි. එහිදී අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගෙන නොතිබූ අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ගිවිසුම තහවුරු කර හෝ නොතිබුණි. | විදුලිබල අමාත්‍යාංශයේ, විදුලිබල මණ්ඩලයේ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවති රැස්වීමකදී තීරණය කල පරිදි ලංකා විදුලිබල මණ්ඩලය යටතේ පවතින පුද්ගලික සමාගම වෙත බලශක්ති අමාත්‍යංශයේ ලේකම්තුමාගේ අනුමැතියට අනුව මෙම කුඩා ප්‍රමාණ ජල විදුලි බලාගාරය ඉදිකිරීමට හා ක්‍රියාත්මක කිරීම පවරා ඇත. | අවබෝධතා ගිවිසුමට එලඹීමේදී අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය නිෂ්කාශනය,අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති නිර්දේශ ලබා ගත යුතුය. |
| (iii) | උක්ත අවබෝධතා ගිවිසුමේ පළමුවන හා හයවන වගන්ති අනුව විදුලි බලාගාරය ඉදිකිරීමේදී පුද්ගලික සමාගමට එය උගසට තබා සම්පත් බැංකුවෙන් ණය ලබා ගැනීමට හැකි බවත් ණය ගෙවීම පැහැර හැරිය හොත් සම්පත් බැංකුව වෙත අදාල ජලවිදුලි බලාගාර පවරා ගතහැකි බවත් කොන්දේසි ඇතුළත් කර තිබුණි. එකී කොන්දේසි රජයේ ඉඩම් ආඥාපනතේ විධිවිධානයන්ට පටහැනි වූ අතර අනාගතයේදී ජලවිදුලි බලාගාරය පිහිටි ඉඩමේ අයිතිය රජයෙන් බැහැර වීමේ අවධානමක් ද නිර්මාණය කර තිබුණි. | ඉදිකිරීම සඳහා වන පිරිවැය සපයාගැනීම සඳහා ණය මුදලක් ලබාගන්නා බවත් ණය ගෙවීම පැහැර හැරියහොත් සම්පත් බැංකුව වෙත අදාළ විදුලි බලාගාරයේ ක්‍රියාකාරීත්වය ණය මුදල පියවා ගන්නා තෙක් පවරා ගන්නා බවත් අවබෝධතා ගිවිසුමේ සඳහන්ය. එසේ පවරා ගත්තද මෙම අවබෝධතා ගිවිසුමේ කරුණු ක්‍රියාත්මක බවද සඳහන්ය. ඒ අනුව විදුලි බලාගාරයේ අයිතිය පවරාදීම සම්බන්ධයෙන් වන වගන්ති ඇතුළත් නොවන නිසා ඉඩමේ අයිතිය රජයෙන් බැහැර වීමෙක් සිදුවීමට හැකියාවක් නැත. එහෙත් මේ සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | අවබෝධතා ගිවිසුමට එලඹීමේදී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය,අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගත යුතුය. |
| (iv) | මෙම අවබෝධතා ගිවිසුමේ 7.1, 7.2, 8 හා 9 වගන්තිවලට ඇතුළත් පහත දැක්වෙන කොන්දේසි මුදල් රෙගුලාසි වල විධිවිධානයන්ට පටහැනි විය.<br>(i) 7.1 වගන්තිය<br>ප්‍රමිතිගත බලශක්ති මිලදී ගැනීම්වලට අනුව විදුලිබල මණ්ඩලය විසින් ජනනය කරන ලද බලශක්තිය මිලදී ගනු ඇත. ආදායමෙන් සියයට 15 ක් මාසික පදනමින් ගණනය කර රාජ්‍යභාග ගෙවීමට පුද්ගලික සමාගම එකඟ වේ.<br>(ii) 7.2 වගන්තිය<br>දැදුරුඔය ජලාශය නඩත්තු කිරීම සම්බන්ධ ඕනෑම වියදමක් වාරිමාර්ග | අවබෝධතා ගිවිසුමේ සඳහන් මුදල් රෙගුලාසි වලට පටහැනි 7.1, 7.2, 8 හා 9 වගන්ති නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත. | අවබෝධතා ගිවිසුමට එලබීමේදී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය,අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති නිර්දේශ ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂ (කුරුණෑගල) විසින් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරියෙකු විසින් අනුමත කරන ලද 7.1 හි එකතු කරන ලද සමුච්චිත රාජ්‍යභාග ගෙවීමේ උපරිමයක් දක්වා ගෙවීම අනුමත කරන පාර්ශ්වයකට ආපසු ගෙවනු ලැබේ.<br><br>(iii) 8 වගන්තිය<br>ඉහත 7.1 හි හෝ ඉහත 7.2 ප්‍රකාර වියදම් ගෙවීම් පියවීමෙන් පසුව හෝ නියම කර ඇති කිසියම් ඉතිරි මුදලක් වේ නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තැන්පතු ගිණුමට ගෙන යා යුතුය.<br><br>(iv) 9 වගන්තිය<br>ව්‍යාපෘතියේ ආයු කාලය දක්වා පෙන්ස්ටොක් සහ ඉන්ටේක් ව්‍යුහයට අදාළ ඕනෑම නඩත්තු සහ අලුත්වැඩියා කටයුත්තක් පුද්ගලික සමාගම විසින් සිදු කරනු ලැබේ. | | |
| (v) | ජලාශය ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ජලය සැපයීම වුවද උක්ත අවබෝධතා ගිවිසුමේ 4, 5 වගන්තිය අනුව උපරිම විදුලි උත්පාදනයක් කළ හැකි පරිදි ජලය නිදහස් කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහාය දැක්විය යුතු බවට වූ කොන්දේසි ඇතුළත් කිරීමෙන් උක්ත අරමුණ සඳහා ප්‍රමුඛතාවය ලබාදීම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කර තිබුණි. | 4.5 වන වගන්තියට අනුව වාරිමාර්ග කටයුතු සඳහා නිකුත් කරන ජලය හා වාන් ජලය උපයෝගී කරගෙන උපරිම ධාරිතාවයෙන් ජල විදුලිය නිපදවන බව සඳහන් වී ඇත. 5 වන වගන්තියට අනුව පහළ කොටසේ වගාවන්ට බාධා නොවන පරිදි ජල විදුලිය නිපදවන බව සඳහන් ය. ජල විදුලිය නිපදවීම සඳහා ජලය නිකුත් කිරීමේ තාක්ෂණය හා වගාවන්ට ජලය නිකුත් කිරීමේ තාක්ෂණය ගැලපෙන ආකාරයට සිදුකර උපරිම කාර්යක්ෂමතාවයෙන් ජල විදුලිය නිපදවීම අරමුණ බව එම වගන්ති වල සඳහන් වී ඇත. මෙය දෙපාර්ශවය විසින් අන්‍යෝන්‍ය අවබෝධයෙන් සිදුකල යුතු කාර්යයන් බැවින් එසේ සිදුකිරීම සම්බන්ධව එම වගන්ති මගින් පැහැදිලි කර ඇත. විදුලිය නිෂ්පාදනය කරනු ලබන තීරණ අනුව මෙම විදුලි බලාගාරයේ ක්‍රියාකාරකම් සිදුකිරීම අනිවාර්යය වන බැවින් ඒ සඳහා තීරණ ගැනීමට කමිටුවක් පත්කර ඇත. ජලාශයෙන් නිකුත් කරන ජලයෙන් උපරිම විදුලි බලයක් නිපදවීම සඳහා මෙම වගන්ති ඇතුළත් කර ඇත. | අවබෝධතා ගිවිසුමට එලඹීමේදී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය, අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති නිර්දේශ ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයකින් තොරව හා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විදුලි ජනනය මගින් උපයන ආදායමෙන් සියයට 15 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු බවට වූ කොන්දේසි ඇතුළත් කර තිබුණි. තවද ගාස්තු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයකරනු ලබනපොලී හෝ ප්‍රමාද ගාස්තු ආදී කරුණු ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන්ද එකී ගිවිසුම රජයට අවාසිදායක විය. | මෙය මූලිකවම පිළියෙල කරන ලද අබබෝධතා ගිවිසුමක් වන අතර ඒ සඳහා වන ආයෝජනය සහ ක්‍රියාකාරිත්වය සලකා යාවත්කාලීන කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන 10 වන වගන්තියේ සඳහන් කර ඇත. ඒ අනුව වාරිමාර්ග අධ්‍යක්ෂ (කුරුණෑගල) හා වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල කලමනාකරණ) වෙත ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇත ලබා දී ඇත. | විදුලි උත්පාදන ආදායම් ප්‍රමාදය සඳහා ප්‍රමාද ගාස්තු පිළිබඳ නව ගිවිසුමකට එළඹිය යුතුය. |
| (vii) | 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුල ජල විදුලි බලාගාරයෙන් ලැබී තිබූ රු.3,085,051 ක ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබූ අතර එම මුදලින් 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා කාලය සඳහා වාරියපොල ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ රු.3,085,051 ක දුරකථන බිල්පත්, ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවීම සඳහා පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කර තිබුණි. 2023 ජුනි 13 දින පුද්ගලික සමාගමෙන් ලැබී තිබූ රු.2,000,000 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඉන් රු. 1,968,532 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාල දුරකථන, ජල බිල්පත් හා විදුලි බිල්පත් පියවීමට වැයකර තිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නැත | ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු ආදායම් වියදම් සඳහා යොදා නොගත යුතුය. |
| (ආ) | යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය | | |
| **(i)** | යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය 2012 වර්ෂයේ ආරම්භකර 2021 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම්කර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දක්වා කාලය දීර්ඝකර තිබුණි. 2011 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මි 39,375 ක් මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ මත ව්‍යාපෘතිය යටතේ වූ ඉස්සන් වැවෙහි සංවර්ධන කටයුතු සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබාදී එහි ඉදිකිරීම් නිම කර අදාල පවුල් වහාම පදිංචි කිරීමට කටයුතු කර අනෙකුත් ක්‍රියාකාරකම් තාවකාලිකව නැවැත්විය යුතු වුවද විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද මේ දක්වා ව්‍යාපෘතිය නියමිත පරිදි නිම නොකිරීම හේතුවෙන් දරන ලද රු.මි. 39,375 ක | ව්‍යාපෘතියේ ප්‍රතිලාභ සම්බන්ධයෙන් පිළියෙල කරන ලද වාර්තාව අනුව කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගත් ඉඩම් ප්‍රමාණයන් ව්‍යාපෘතිය ආරම්භයට පෙර හා පසු තත්වය දැක්වෙන අතර ඒ අනුව යල කන්නයේ වගාව අක්කර 19,787 මහ කන්නයේ වගාව අක්කර 5,382 කින් වැඩි වී ඇත. මෙමඟින් ලැබෙන ආර්ථිකමය ප්‍රතිලාභ සරලව ගණනය කළහොත් අක්කරයකට වී බුසල් 115ක් ලැබේ යැයි පදනම මත හා වී කිලෝවක මිල රු. 80 ක් ලෙස ගණනය කළ හොත් වාර්ෂිකව රු. මිලියන 5,000 කට ආසන්න මුදලක් ලැබේ. මෙයට අමතරව මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන අනෙකුත් | ව්‍යාපෘතිය යටතේ වූ ඉස්සන් වැවෙහි සංවර්ධන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම හා අදාල පවුල් වහාම පදිංචි කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිරිවැයට, ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක් වී නොතිබුණි. | මූල්‍යායමය ප්‍රතිලාභ සැළකිය යුතු ප්‍රමාණයක්ද ඇත. | |
| (ii) | මහා පරිමාණ ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු බාර ගැනීමේ දී අනුගමනය කළ යුතු නිශ්චිත පටිපාටීන් දක්වා උපදෙස් නිකුත් කිරීම, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කර ගැනීම සම්බන්ධව විශ්ලේෂණාත්මක වාර්තා සකස් කර පසුවිපරම් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම යන කටයුතුවල සියලු තොරතුරු ඇතුළත්ව තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම හා ලේඛන විධිමත්ව නඩත්තු කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම යන කටයුතු කඩිනමින් නිම කිරීම, EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් නිම කළ යුතු සියලු වැඩ නිම කර නොතිබිය දී හා කාර්යයන් පිරිවිතර ප්‍රකාරව ඉටුකර නොතිබියදී කාර්සාධන සහතික නිකුත් කර ගෙවීම් සහතික කළ නිළධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කිරීම, කාර්යසාධන සහතිකය නිකුත් කිරීමෙන් පසු වැඩ බිමෙන් විධිමත් පරිදි ඉවත් නොවී පරිහරණය කරනු ලැබූ රජයේ ඉඩම් හා දේපල වල වටිනාකම තක්සේරු කර බදු කුලිය අය කර ගැනීම, කොන්ත්‍රාත්කරු විසින් භාවිත කරන ලද වැලි කළුගල් හා පස් වෙනුවෙන් රජයට අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු හා රාජ්‍ය භාගය අයකර ගැනීමට පියවර ගත යුතුවීම යන විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | විමසා ඇති සමහර කරුණු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මට්ටමින් පිළිතුරු සැපයීමට අසීරුය. මෙම වාර්තාවේ විමසීම් කරන ලද සමහර කරුණු සම්බන්ධයෙන් විස්තර දක්නට නොමැත. නමුත් ඉඩම් අත්පත් කර ගැනීමට අදාල සාරාංශ තොරතුරු, ගිණුම් සාරාංශ සහ අවසන් ගිණුම් වාර්තාවක් සකසා ඇත ව්‍යාපෘතිය යටතේ පැවති වත්කම් වෙනත් ස්ථාන වෙත යොමු කිරීමේදී නිකුත් කිරීමේ නියෝග හා ලැබීමේ නියෝග පත් පිළිබඳ විස්තර ඇත. සේවායෝජක අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍යය වන ව්‍යාපෘති පරිපාලනයට අදාල ලේඛන ද නොමැත. මහා පරිමාණ ව්‍යාපෘතින් භාර ගැනීමේදී මහා පරිමාණ ව්‍යාපෘතින් අවසන් කර භාර දීම සම්බන්ධව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උපදෙස් මේ වන විට සකසා ඇත. | මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි කොන්ත්‍රාත් පරිපාලනයට සම්බන්ධ කරුණු, ප්‍රතිපත්තිමය කරුණු ලෙස අර්ථ දක්වා ක්‍රියා නොකළ යුතු අතර අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී නිරීක්ෂණයන්හී සඳහන් කරුණු ඇතුළුව සාර්ව ආර්ථික බලපෑම පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්තා කළ යුතුය. |
| (iii) | හොරොව්පොතාන හා ගොමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවලට අයත් ගොඩ සහ මඩ ඉඩම් හෙක්ටයාර 4,148 ක් ජලාශයේ ජලයෙන් යටවී තිබුණි. නව ඉඩම් හෙක්ටයාර 1,515 කට වාරි ජල පහසුකම් සපයා වගාවන්ට එක් කිරීමේ මූලික අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද මේ දක්වා නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 421 ක් පමණක් වගාකිරීම සඳහා වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම්කර තිබූ නව කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1,094 ක් හෙවත් සියයට 72 ක් මේ දක්වා හඳුනාගෙන වගාකිරීම සඳහා ගොවීන් වෙත ලබාදී නොතිබුණි. | ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා සැළසුම් කළ වාරි ඉඩම් ප්‍රමාණය වන සංරක්ෂණ හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නිදහස් කිරීමට එකඟ වූ ප්‍රමාණය හා මෙතෙක් සංවර්ධනය කර අවසන් ප්‍රමාණය අනුව නිදහස් වූ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 83 ක් පමණ දැනට සංවර්ධනය කර ඇති අතර ඉතිරි ඉඩම් වල සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී. | සැලසුම්කල පරිදි ඉඩම් හඳුනාගෙන වගා කිරීම සඳහා ගොවීන් වෙත භාරදී ජලය සැපයිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | ව්‍යාපෘතිය නිසා කුඹුරු ඉඩම් අහිමිවූවන් වෙනුවෙන් උපරිමය අක්කර 1.5 බැගින් ලබාදීමට සැලසුම් කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස්කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමට නොහැකි වී තිබුණි. ඒ වෙනුවට පවුල් 506 ක් සඳහා රු.1,800,000 බැගින් රු. 910,800,000 ක් අතිරේක වන්දි 2024 මැයි 31 වන විට ගෙවා තිබුණි. | යාන් ඔය ජලාශය ඉදි කිරීමේදී වාරි ඉඩම් අහිමිව වාරි ඉඩම් ලබා දිය යුතු 1,113 ක ලේඛනයක් ප්‍රාදේශීය ලේකම් හොරොව්පතාන විසින් ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කර ඇත. එම ලේඛනයට අනුව මෙම 1,113 වෙත වාරි ඉඩමක් ලබා දිය යුතු වුවද අනුරාධපුර දිස්ත්‍රික්කය තුලින් සැපයිම් කළ වාරි ඉඩම් ප්‍රමාණය වන ඕමාරකඩින් හෙක්ටයාර 507න් හෙක්ටයාර 40ක් හා ඉස්සන්වැවෙන් හෙක්ටයාර 444න් හෙක්ටයාර 377.45 පමණක් නිදහස් විය. මේ අනුව වාරි ඉඩම් ප්‍රමාණවත් නොවීම තුල ගොවිතැන ජීවනෝපාය නොවන හා පිට පළාත් පදිංචි පවුල් 614ක් සඳහා විකල්ප ඉඩම් වෙනුවට රු. මිලියන 1.8ක අතිරේක වන්දි මුදලක් අක්කර 1.5ක් සඳහා ගෙවීමට අමප/24/0395/623/009, අංක දරන 2024 මාර්තු 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මුලින්ම ප්‍රාදේශීය ලේකම් විසින් යොමු කළ පවුල් 506ක් සඳහා මිලියන 1.8 බැගින් ගෙවන ලදී. | කුඹුරු ඉඩම් අහිමිවූවන් වෙනුවෙන් ලබාදීමට සැලසුම් කර තිබූ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස්කර ගොවීන් වෙත ලබාදීමටත් අතිරේක වන්දි පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | යාන්ඔය ජලාශය ඉදිකිරීම සඳහා වාරි ඉඩම් කට්ටි 2,044 ක් හා වම් ඉවුරු ඇල ඉදිකිරීම සඳහා වාරි ඉඩම් කට්ටි 313 ක් වශයෙන් වාරි ඉඩම් කට්ටි 2,355 ක් ප්‍රගමන රේඛන අනුව අත්පත්කරගෙන තිබුණි. ව්‍යාපෘතිය යටතේ ඕමාරකඩ හෙක්ටයාර් 506, ඉස්සන්වැව හෙක්ටයාර් 444 ක් මෝරාගම හා ඉඳුල්හිටියාව හෙක්ටයාර් 337 ක් සහ කොහොඹගස් වැව හෙක්ටයාර් 227 ක් ලෙස නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 1,514 සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබූ නමුත් ඉන් කොටසක් පමණක් සංවර්ධනය කර ජලාශයට යටවූ කුඹුරු හිමියන් සඳහා බෙදා දී තිබූ නමුත් එසේ බෙදා දුන් කුඹුරු ඉඩම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමේ ප්‍රමාණය නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකිවිය. | විකල්ප වාරි ඉඩම් ලබා දෙන ලද පවුල් නාම ලේඛන අදාල ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් අප වෙත යොමු කර ඇත. එම ලේඛන යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යනු ලැබේ. | කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමේ ප්‍රමාණය නිවැරදිව තහවුරු කර ගත හැකිවන පරිදි සංසන්දනාත්මක ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (vi) | ජලාශය ඉදිකිරීම සඳහා හොරොව්පොතාන හා ගොමරන්කඩවල ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයන් වලට අයත් ගොඩ සහ මඩ ඉඩම් හෙක්ටයාර 4,148 ක් යටතේ වූ ඉඩම් | අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී අත්පත් කර ගැනීම ප්‍රාදේශීය ලේකම් මඟින් සිදුවේ. හිමිකම් පරීක්ෂණ ප්‍රාදේශීය | අත්පත් කරගෙන ඇති ඉඩම් සඳහා වන්දි ගෙවා අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කට්ටි 4,352 ක් අත්පත් කරගෙන තිබූ අතර ඉන් වන්දි ගෙවියයුතු ඉඩම් කට්ටි ගණන 3,621 ක් විය. 2024 මැයි 31 දිනට ඉඩම් කට්ටි 3,515 ක් සඳහා වන්දි ගෙවා අවසන් කර තිබුණද ඉඩම් කට්ටි 108 ක් සඳහා වන්දිගෙවිය යුතුව තිබුණි. මෙම ඉඩම් කට්ටි 108 අත්පත්කරගෙන වසර 8-9 අතර කාලයක් ගතවී තිබූ නමුත් මෙම ඉඩම් සඳහා කිසිදු වන්දියක් 2024 මැයි 31 වන විට ගෙවා නොතිබුණි. | ලේකම් මඟින් සිදුකරනු ලබන අතර තක්සේරු කිරීමේ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදු වේ. අදාල තක්සේරු වාර්තා ප්‍රාදේශීය ලේකම් විසින් ව්‍යාපෘති කාර්යාලය වෙත යොමු කළ පසු ගෙවීම් කිරීම සිදු වේ. අදාල තක්සේරු ප්‍රමාද වීම හා හිමිකම් පරීක්ෂණ වලදී පැන නගින ගැටළු මත ගෙවීම් කටයුතු ප්‍රමාද වීම් සිදු වේ. | |
| (vii) | ජලාශයේ වම් ඉවුරු ඇල ඉදිකිරීම සඳහා හොරොව්පොතාන, කැබිතිගොල්ලෑව, පදවිය හා ශ්‍රීපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් වලට අයත් ඉඩම් හෙක්ටයාර 75.5 ක් යටතේ වූ ඉඩම් කට්ටි 769 ක් අත්පත් කරගෙන තිබූ අතර ඉන් වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි ගණන 528 ක් විය. 2024 මැයි 31 දිනට ඉඩම් කට්ටි 348 ක් සඳහා වන්දිගෙවා අවසන් කර තිබූ අතර ඉඩම් කට්ටි 180 ක් සඳහා වන්දිගෙවිය යුතුව තිබුණි. ඉඩම් අතපත්කරගෙන වසර 4-5 අතර කාලයක් ගතවී තිබූනද අදාල ඉඩම් සඳහා කිසිදු වන්දියක් 2024 මැයි 31 වන විට ගෙවා නොතිබුණි. | අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී ඉඩම් අත්පත් කර ගැනීම,හිමිකම් පරීක්ෂණ පැවැත්වීම ප්‍රාදේශීය ලේකම් මඟින් සිදු කෙරේ. තක්සේරු ලබා දීම තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදු වේ. මෙම ආයතන මඟින් අදාල තක්සේරුව ලැබෙන තෙක් වන්දි ගෙවීම් කටයුතු සිදු කළ නොහැක. | අත්පත් කරගෙන තිබූ ඉඩම් සඳහා වන්දි ගෙවා අවසන් කළ යුතුය. |
| (viii) | වන්දි ගෙවීමේ ප්‍රමාදවීම හේතුවෙන් අත්පත්කරගත් ඉඩම් සඳහා 38(අ) අතුරු විධිවිධාන ගැසට්කළ දින සිට තක්සේරු වාර්තා ලබාදීමේ ප්‍රමාදය මත පූර්ණ වන්දියට අදාල ව්‍යාවස්ථාපිත වන්දිය සඳහා සියයට 7 ක පොලි මුදලක් වසර 5 කට වැඩි කාලයක් සඳහා ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව 2024 මැයි 31 දිනට රු.1,275,580,533 ක් පොලී වශයෙන් ගෙවා තිබුණි. මෙසේ ගෙවූ පොලී ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි. | 38 (අ) අතුරු නියෝගය නිකුත් වීමෙන් පසු මැනුම් කටයුතු සිදු කිරීම, මැනුම් සිතියම් සැකසීම මිනින්දොරු දෙපාර්තමේන්තුව මඟින් සිදු වේ. හිමිකම් පරීක්ෂණ හා අත්පත් කර ගැනීම ප්‍රාදේශිය ලේකම් මඟින් සිදු වේ. තක්සේරු කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදු වේ. මෙම ක්‍රියාවලිය අවසන් තක්සේරු වාර්තාව ව්‍යාපෘති කාර්යාලය වෙත ලැබෙන තෙක් වන්දි ගෙවීම් සිදු කළ නොහැක. ඒ අනුව අදාල ප්‍රමාද කාලයන් සඳහා පොලී මුදල් ගෙවීමට සිදුවනු ඇත. | ගෙවූ පොලී ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකිවන පරිදි වාර්තා සකස්කර ඉදිරිපත් කළ යුතුය. |
| (ix) | වන්දිගෙවීම් සම්බන්ධයෙන් 2024 පෙබරවාරි 21 ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් 2022 වර්ෂය වන විට හොරොව්පොතාන, කැබිතිගොල්ලෑව, පදවිය ප්‍රදේශිය ලේකම් කොට්ඨාශ වලින් බැහැරව ස්ථිර පදිංචි පවුල් ඒකක 614 ක් සඳහා අක්කර 1.5 ක වාරි ඉඩම් වෙනුවට රු.1,800,000 ක් ලෙස සංශෝධනය කර ගෙවීමට අනුමැතිය ඉල්ලා තිබූ අතර මේ | වම් ඉවුරු ඇල යටතේ වාරි ඉඩම් අහිමි වූ අයවලුන් වෙත විකල්ප ඉඩමක් වෙනුවට අතිරේක වන්දියක් ගෙවීම සම්බන්ධයෙන් නැවත සළකා බැලීමටත් ඒ සම්බන්ධව වාර්තාවක් පිළියෙල කිරීමටත් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත. මේ වන | රු.1,800,000 ක් දක්වා වන්දි මුදල් වැඩිකිරීමට හේතුවූ කරුණු හා ඉතිරි පුද්ගලයන් 328 දෙනා වෙනුවෙන් ගනු ලැබූ විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා 2024 මාර්තු මස 18 දිනැති අමප/24/0395/623/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2024 මැයි 31 වන විට පවුල් 506 ක් සඳහා රු.1,800,000 බැගින් රු. 910,800,000 ක අතිරේක වන්දි ගෙවා තිබුණි. එහිදී රු.1,800,000 ක් දක්වා වන්දි මුදල් වැඩිකිරීමට හේතුවූ කරුණු හා ඉතිරි පුද්ගලයන් 328 දෙනා වෙනුවෙන් ගනුලැබූ විකල්ප ක්‍රියාමාර්ග සඳහන්කර නොතිබුණි. | විට එම කමිටු වාර්තාව ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරනු ඇත. | |
| (x) | නියමිත දිනට ඉඩම් ලබා නොදීම හේතුවෙන් ජලාශයේ වේල්ල ඉදිකිරීමේදී කුඹුරු ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2014/2015 මහ කන්නයේ සිට 2018/2019 මහ කන්නය දක්වා අක්කරයකට රු. 35,000 බැගින් වගා අහිමි කන්න 9 ක් සඳහා රු. 345,452,574 ක කන්න වන්දි ගෙවා තිබුණි. වම් ඉවුරු ඇල ඉදිකිරීමේදී ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2018 යල කන්නයේ සිට 2020 මහ කන්නය දක්වා අහිමි කන්න 4 ක් සඳහා අක්කරයකට රු. 50,700 ක් හා අහස් දියෙන් වගා කරන ගොවීන්ට අක්කරයකට රු.35,000 ක් බැගින් කන්න වන්දී රු. 123,494,081 ක් ගෙවා තිබුණි. ඒ අනුව ඉඩම් අහිමි වූවන්ට නියමිත පරිදි කුඹුරු ඉඩම් ලබා නොදීම නිසා රු.468,846,655 ක කන්න වන්දී ගෙවීමට සිදුවී තිබුණි. මෙසේ ගෙවූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි. | ඉඩම් නිදහස් කර ගැනීම හා ඊට අදාල පූර්ණ වන්දි ගෙවීම දක්වා කාල පරිච්ඡේදය සඳහා ගොවිතැන් කටයුතු කිරීමට නොහැකි වීමට අදාලව වන්දි ගෙවීම් කර ඇත. මේ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන ඇත. | කන්නය සඳහා වූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකිවන පරිදි වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (xi) | වාරි ඉඩම් ලබා නොදීම හේතුවෙන් ජීවනෝපාය මාර්ග අහිමි වූ පුද්ගලයෙකුට මාසිකව රු. 2,000 බැගින් උපරිමය රු.8,000 දක්වා ජීවනාධාර දීමනාවක් ලෙස 2024 මැයි 31 දක්වා රු. 481,918,000 ක් ගෙවා තිබුණි. මේ සඳහා එක් එක් පුද්ගලයන් වෙනුවෙන් ගෙවන ලද ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි පොත්පත් පවත්වා නොතිබීම හේතුවෙන් ඒ සඳහා දැරූ පිරිවැය ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි. | ජලාශය යටතේ වාරි ඉඩම් අහිමි වූ පවුල් සඳහා විකල්ප වාරි ඉඩමක් ලබා දෙන තෙක් මාසික යැපීම් දීමනා ගෙවන ලද අතර විකල්ප වාරි ඉඩම වෙනුවට අතිරේක වන්දිය ලබා ගත් අයගේ යැපීම් දීමනා නතර කර ඇත. ජීවනාධාර ගෙවීම් ලේඛන ප්‍රාදේශීය ලේකම් විසින් මාසිකව පිළියෙල කර ව්‍යාපෘති කාර්යාලය වෙත යොමු කරන අතර එම ලේඛන පාදක කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් වෙත අදාල මුදල නිදහස් කිරීම සිදු වේ. ජීවනාධාර ලබා ගත් අයගේ ලේඛන යාවත්කාලීන කරමින් පවතී. | ජීවනාධාර දීමනාව ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකි පරිදි වාර්තා පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (xii) | දැනටමත් වගාකරන ඉඩම් හෙක්ටයාර 8,700 ක වගා තිව්‍රතාවය වැඩි කිරීම සඳහා වාරි ජල පහසුකම් සැපයීමට අපේක්ෂා කර තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දිනට පැවති ඉඩම් හෙක්ටයාර් 5,956 සඳහා පමණක් දෙකන්නයෙහි වගා කිරීම සඳහා වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම් කරන ලද කුඹුරු ඉඩම් හෙක්ටයාර් 2,794 ක් හෙවත් සියයට 32 ක් සඳහා දෙකන්නයේ වගාකිරීමට වාරි පහසුකම් සපයා නොතිබුණි. | මෙම කරුණට අදාලව සවිස්තරාත්මක විස්තරයක් වාර්තාවේ ඇත. | අපේෂා කළ පරිදි කුඹුරු ඉඩම් සඳහා වාරි පහසුකම් සැපයිය යුතුය. |
| (xiii) | මෙම ජලාශය ඉදිකිරීම මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 50,000 කට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවුල් 20,000 කට පානීය ජලය සැපයීම සැලසුම් කර තිබූ නමුත් මේ වනවිට කොපමණ පවුල් ප්‍රමාණයකට පානිය ජල පහසුකම් සපයා තිබුණේද යන්න තහවුරු කල හැකි ලේඛන විගණනයට ඉදිරිපත් කර නොකෙරුණි. | මෙම ව්‍යාපෘතිය යටතේ පානීය ජලය සඳහා 24 MCM ජල ප්‍රමාණයක් ජල සම්පාදන මණ්ඩලය සඳහා වෙන් කර ඇත. එම ජල ප්‍රමාණය ඔවුන්ට අවශ්‍ය ඕනැම අවස්ථාවක ලබා ගත හැක. | සැලසුම් කර තිබූ පවුල් සඳහා පානීය ජලය සැපයීය සම්බන්ධයෙන් යාවත්කාලීන ලේඛන පවත්වාගෙන යායුතුය. |
| (xiv) | ප්‍රාදේශිය කිලෝමීටර 16 ක දිගින් යුතු අලි වැටක් ඉදිකිරීම සැලසුම් කර තිබුණද එම අලිවැට මේ දක්වා ඉදිකර නොතිබුණි. | අලි වැටවල් ඉදි කිරීම මේ වන විට වන ජීවි දෙපාර්තම්න්තුවට කළ නොහැකි බව දන්වා ඇතත් එම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන එම කාර්යය ඉටු කිරීමට ඉදිරියේදී බලාපොරොත්තු වේ. | සැලසුම්කළ අලිවැට ඉදිකිරීම කළ යුතුය. |
| (xv) | රු.මිලියන 36,855 ක් වූ යාන් ඔය ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුව 2021 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් රු.මිලියන 48,355 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එකී ප්‍රතිපාදන ප්‍රධාන වැඩකොටස් 6 ක් යටතේ වූ උප අයිතම 22 ක් යටතේ හඳුනාගෙන තිබූ අතර එම එක් එක් උපවිෂයය යටතේ දරන ලද වියදම් සම්බන්ධයෙන් වෙන් වෙන්ව ගිණුම් තබා නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත සීමාව තුල අදාල වියදම් දරා ඇති බව විගණනයට තහවුරු කරගත නොහැකිවිය. | මෙම ව්‍යාපෘතියේ කොටසක් EPC කොන්ත්‍රාත්තුවක් යටතේ ඉටු කර ඇත. තවත් කොටසක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් තව දුරටත් කරගෙන යයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් කරන සියළු ඉදි කිරීම් සඳහා ගෙවීම් කටයුතු වලට අදාල වියදම් වාර්තා නිසි අයුරින් පවත්වා ගෙන යයි. EPC කොන්ත්‍රාත්තුවට අයත් ගෙවීම් කරනුයේ කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇති නිර්නායකයන්ට අනුවය. ඒ අනුව අදාල ගෙවීම් වාර්තා සියල්ල නඩත්තු කර ඇත. | එක් එක් උප විෂයය යටතේ දරන ලද වියදම් හා ඇස්තමේන්තුගත වියදම් වෙන් වෙන්ව ගිණුම් තැබිය යුතුය. |

(ඇ) **පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය**

| | | |
|---|---|---|
| මොණරාගල දිස්ත්‍රික්කයේ ඇති වටගල ආර වැව, මල්ලිපොත වැව, දෙබර ආර වැව මගින් ජලය ඝන මීටර් කියුබ් රු.මිලියන 2.45 සැපයීමෙන් පවතින ඉඩම් හෙක්ටයාර 971 හා නව ඉඩම් හෙක්ටයාර 728 ක් දෙකන්නයේ වගා කිරීම සඳහා ජලය සැපයීම සඳහා රු.මිලියන 1,250 ක ඇස්තමේන්තුවක් යටතේ 2007 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 776.23 ක් හා භෞතික ප්‍රගතිය සියයට 91 ක් වී තිබූ අතර හෙක්ටයාර් 723 ක් සඳහා පමණක් වාරි ජලය ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘති ආරම්භ කර වසර 17 ක් ගතවී තිබුණද සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ ඉඩම් හෙක්ටයාර් 976 ක් හෙවත් සියයට 57 ක් සඳහා වාරි ජලය සැපයිමට කටයුතු කර නොතිබුණි. නව ඉඩම් හඳුනාගැනීමත් වාරි ජලය සැපයීමට පහල නිම්න සංවර්ධන කටයුතු සිදු නොකිරීමත් නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂාකර තිබූ ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක්කර නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භයේදී කුඩා වැව් 55ක් සංවර්ධනය සඳහා අදියර 3ක් යටතේ යොජනා කර ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීම, සමහර වැව් වෙනත් ව්‍යාපෘතීන් මගින් ක්‍රියාත්මක කිරීම හා තාක්ෂණික ශක්‍යතාවයන් නොමැති වීම වැනි හේතූන් මත සමහර අයිතමයන් ඉවත් කර ඇත. ඒ අනුව එක් එක් අදියර යටතේ යෝජිත වැඩ වලින් කොටස් ඉවත් කර ඇත.එබැවින් ව්‍යාපෘතිය ආරම්භයේ ජලය සැපයීමට යෝජිත වගා ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 723 දක්වා අඩුවී ඇත. එසේම මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022 ඔක්තොම්බර් 07 වන දිනැති ලිපියට අනුව දෙන ලද උපදෙස් අනුව ව්‍යාපෘතියෙහි ඉදිරි වැඩ කටයුතු කර ඇත. | පහල නිම්න සංවර්ධන කටයුතු මගින් අපේක්ෂා කල ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක් කළ යුතුය. |

(ඇ) මොරාණ ජලාශ ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් හෙක්ටයාර 570 කට ජලය ඝන මීටර් කියුබ් මිලියන 16 ක් සැපයීම සඳහා රු.මි.2,900 ක ඇස්තමේන්තුවක් යටතේ 2012 වර්ෂයේ සිට මෙම ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 2,725.87 ක් හා භෞතික ප්‍රගතිය සියයට 99 ක් වී තිබුනද වාරි ජලය නව ඉඩම් හෙක්ටයාර් 449 ක් සඳහා පමණක් ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වසර 14 ක් ගතවී තිබූ නමුත් සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ නව ඉඩම් හෙක්ටයාර් 121 ක් හෙවත් සියයට 21 ක් සඳහා වාරි ජලය සැපයිමට කටයුතු කර නොතිබුණි. තවද ජලාශය හා ප්‍රධාන ඇල සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම හා විකල්ප ඉඩම් ලබා දීමද ප්‍රමාද වී තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉදි කිරීම් සියල්ල ඉදි කර අවසානය. ඉතිරිව ඇත්තේ වන්දි ගෙවීමට අදාල කටයුතු සම්පූර්ණ කිරීම හා යෝජිත වගා බිම් වලින් කොටසක් සැකසීමට පමණි. ඉඩම් සැකසීම මේ වන විට කර ගෙන යනු ලබන අතර එම කාර්යය මෙම වසරේදි ඉටු කරනු ඇත. වන්දි ගෙවීමේ කාර්යය ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලින් තක්සේරු වාර්තා ලැබුණු පසු සිදුකරනු ලැබේ. | සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ නව ඉඩම් සඳහා වාරි ජලය සැපයිමට කටයුතු කළ යුතුය ව්‍යාපෘතියට ආදාල පාරිසරික බලපෑම් ඇගයීම නිසි පරිදි සිදු කර ජලාශය හා ප්‍රධාන ඇල සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම හා විකල්ප ඉඩම් ලබා දීමද සිදුකළ යුතුය. |

**3.3** **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

(අ) කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද රු.521,548,736 ක පිරිවැයෙන් ජාතික ආර්ථිකයට මේ දක්වා කිසිදු දායකත්වයක් දක්වා නොතිබුණි.මෙමගින් අපේක්ෂිත ප්‍රතිලාභ වන නව සහ වාරි පහසුකම් නොමැති ඉඩම් හෙක්ටයාර 5,429 ක් සඳහා වාරි ජලය සැපයීම,පානීය ජල අවශ්‍යතාවය සඳහා වාර්ෂිකව ජලය ඝන මීටර් මිලියන 12ක් ලබා දීම,විකල්ප මාර්ග කිමීටර් 15ක් පමණ සංවර්ධනය කිරීම,වාර්ෂිකව ගිගා වොට් පැය 16ක ජල විදුලිය උත්පාදනය,මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,නැවත පදිංචි කරනු ලබන ප්‍රදේශයේ නගර සංවර්ධනය සිදු කිරීම සහ අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලිවැට ඉදිකිරීම වුවත් ඉන් කිසිවක් 2023 දෙසැම්බර් 31 දින වන විටද අත්කරගෙන නොතිබුණි. | කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය මහා පරිමාණ වාරි ව්‍යාපෘතියක් වන අතර ඒ යටතේ ඝන මීටර් මිලියන 48 ක විශාල ජලාශයක් ඉදි කිරීම හා ඒ යටතේ කුඩා වැව් රාශියක්ම ප්‍රතිසංකරණය කිරීමට යෝජිත අතර මේ වන විට ඒවායින් සමහරක වැඩ කටයුතු නිම කර ඇත. දක්වා ඇති ප්‍රතිලාභ ජලාශය හා යෝජිත සැළැස්ම ඉදි කිරීමෙන් පසු හිමිවන ප්‍රතිලාභය. ජලාශය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන නොමැතිකම හා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022 ඔක්තෝම්බර් 07 වන දිනැති ලිපිය මගින් දෙන ලද උපදෙස් මගින්කටයුතු කර ඇත. | දරන ලද පිරිවැය තුලින් ලගාකරගත හැකි ආර්ථික ප්‍රතිලාභ මොනවාද යන්න හඳුනාගෙන ඒවා ජාතික ආර්ථිකයට එක් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් දේපළ අහිමිව පීඩාවට පත්වන ජනතාවට වන්දි ගෙවීම සහ නැවත පදිංචි කිරීම මැයෙන් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව ගෙන ඇති අංක අමප 17/0583/729/011 දරන 2017 මාර්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ජනාධිපතිවරයා විසින් මෙවැනි අවස්ථාවල ක්‍රියාත්මක කළ හැකි පොදු වූ වන්දි ක්‍රමයක් ඇති කිරීම සුදුසු බව නිර්දේශ කර තිබුණි. මුදල් ඇමතිවරයා විවිධ ව්‍යාපෘතීන් යටතේ බලපෑමට ලක්වන එකම ප්‍රදේශයේ වෙසෙන පුද්ගලයින්ට විවිධ ක්‍රමවේද යටතේ සලකා ඇති බව නිරීක්ෂණය කර තිබුණි. මෙම ගැටළු මගහැරීම පිණිස ඉඩම්/වගාවන් අහිමි පුද්ගලයින්ට වන්දි ගෙවීමේ නව රෙගුලාසි සැකසීම කඩිනමින් අවසන් කරන ලෙස ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබුණි. ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය ඉඩම් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කොට අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුව පැවති නමුත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022 ඔක්තෝබර් 07 වන දිනැති ලිපියට අනුව දෙන ලද උපදෙස් අනුව කටයුතු කර ඇත. | ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් පොදු වූ වන්දි ක්‍රමයක් හඳුන්වාදී ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනා 07 ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය හා වන්දි ගෙවිය යුතු එක් එක් කාණ්ඩයට අයත් මුළු පවුල් සඳහන් කරමින් අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කල යුතු බවට නියම කර තිබුණද. ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2017 මාර්තු මස 14 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය නොලැබීම නිසා 2022 දෙසැම්බර් 20 දින “පහල මල්වතු ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය හා කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක් වන ජනතාවට වන්දි ගෙවීම හා නැවත පදිංචි කිරීම සඳහා වූ ලාර්ක් , සුපර් ලාර්ක් සහන දීමනා සහ කාර්ය මණ්ඩල වෙත දිරි දීමනා ගෙවීමේ යෝජනාවලිය” මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. | අමාත්‍ය මණ්ඩල සංදේශයේ පිටපතක් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iv) | ඒ අනුව ඉඩම් අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබියදී අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ 2019, 2020, 2021 හා 2022 වර්ෂවලදී ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලින් ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි ගෙවීමට මැදගම,බඩල්කුඹුර, මොණරාගල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත රු. 43,998,988 ක් ගෙවා තිබුණි. එහිදී වන්දි ගෙවීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොමැතිව ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ගෙවා ඇති මුදල් වසර 4 ක කාලයක් තිස්සේ එම කාර්යාලයන්හි පොදු තැන්පත් ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනා ඉදිරිපත් කිරීමේදී, එම ඉඩම් වල දළ ඇස්තමේන්තුවට අනුව වටිනාකම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තැන්පත් කර එම ලදුපත් සමඟ අත්පත් කර ගැනීමේ යෝජනා ඉදිරිපත් කල යුතුය.ඒ අනුව අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් වල දළ වටිනාකමට අනුව මුදල් තැන්පත් කර ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනා ඉදිරිපත් කර ඇත. ඉඩම් අත්පත් කර ගැනීමට අදාල ඉදිරි කටයුතු සිදු කරමින් පවතින විටදී මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022.10.07 වන දිනැති ලිපියට අනුව කටයුතු කිරීමට සිදු විය. මේ සම්බන්ධයෙන් අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් හට දැනුම් දී තැන්පත් කර දී තිබූ මුදල් නැවත ලබා ගැනීමට කටයුතු කර ඇත. | ඉඩම් අහිමිවූවන් හා වන්දි ගෙවියයුතු පුද්ගලයන් හඳුනාගැනීමකින් තොරව මුදල් නිදහස්කළ නිලධාරීන් සම්බන්ධයෙන් හේතු පරීක්ෂා කර විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (v) | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2017 නොවැම්බර් 24 දින ඉදිරිපත් කර තිබූ අංක අමප17/2716/729/029 දරන “කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය හා හැඩ ඔය ජලාශ ව්‍යාපෘතිය ස්විස් චැලේන්ජ් ක්‍රමය (Swiss Challenge Method) යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා චීන සමාගමක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබා ගැනීම” යන මැයෙන් වූ අමාත්‍ය | ශක්‍යතා අධ්‍යයනයේදී මූලිකවම කරනු ලබන්නේ ව්‍යාපෘතියේ ශක්‍යතාවයට අදාල කරුණු අධ්‍යයනය කිරීමයි. මෙහිදී පාරිසරික අධ්‍යයනයකදී බලාපොරොත්තු වන සමහර කරුණු වලට අදාල විස්තර ලබා ගත හැක. පාරිසරික අධ්‍යයනයක් | අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබූ ප්‍රතිපත්තිමය තීරණයට පටහැනිව අවබෝධතා ගිවිසුමකට |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩල සංදේශයට අදාළව මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණ මගින් එම ක්‍රමය යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් ගත වීමට නම් ස්විස් චැලේන්ජ් ක්‍රියාපටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූලව, ප්‍රති යෝජනා කැඳවා තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය අවසන් කළ යුතුය. 2017 දෙසැම්බර් 12 දිනැති අමප17/2716/729/029 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා අදාල මුදල් ඇමතිවරයාගේ නිරීක්ෂණවල සඳහන් පරිදි ස්විස් චැලේන්ජ් ක්‍රමයට අදාළ පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2018 මාර්තු 30 වන දින වාරිමාර්ග ජල සම්පත් කලමනාකරණ අමාත්‍යාංශය සහ චීන සමාගම සමඟ, කුඹුක්කන් ඔය හා හැඩඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට එකඟත්වය ලබා දෙමින් අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබූ ප්‍රතිපත්තිමය තීරණයට පටහැනිව ගිවිසුම් ගත වී රු. 8,929,126 කට අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබුණි. තවද, එකී ගිවිසුමේ පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලිය ආවරණය කර නොතිබුණි. | යනු වෙනමම අධ්‍යයනය කටයුත්තකි. මෙම අධ්‍යයනයන් එම කාර්යයන්ට විශේෂිත දැනුම ඇති පුද්ගලයින් විසින් කරනු ලබන අතර එකම ගිවිසුමක් යටතේ මෙම කරුණු දෙක අධ්‍යයනය කිරීම ප්‍රායෝගික නොවේ. මෙම ස්විස් චැලේන්ජ් ක්‍රමය යටතේ මූලිකවම ශක්‍යතා අධ්‍යයනය කිරීම කර ඇත. | ඇතුළත් වූ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (vi) | විධිමත් ප්‍රසම්පාදන පටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව ශක්‍යතා අධ්‍යයනයේම කොටසක් වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සකස් කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ යටතේ 2023 දෙසැම්බර් 31 දින වන විට රු.5,150,880 ක් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පරිසර ඇමතිවරයාගේ නිරීක්ෂණවල සඳහන් පරිදි පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලියක්ද මූලික අධ්‍යයනයට ඇතුලත් විය යුතුව තිබූ නමුත් එම තීරණයට පටහැනිව උක්ත ගිවිසුම ක්‍රියාත්මක කර අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණි. | ශක්‍යතා අධ්‍යයනයේදී මූලිකවම කරනු ලබන්නේ ව්‍යාපෘතියේ ශක්‍යතාවයට අදාල කරුණු අධ්‍යයනය කිරීමයි. මෙහිදී පාරිසරික අධ්‍යයනයකදී බලාපොරොත්තු වන සමහර කරුණු වලට අදාල විස්තර ලබා ගත හැක. පාරිසරික අධ්‍යයනයක් යනු වෙනමම අධ්‍යයනය කටයුත්තකි. මෙම අධ්‍යයනයන් එම කාර්යයන්ට විශේෂිත දැනුම ඇති පුද්ගලයින් විසින් කරනු ලබන අතර එකම ගිවිසුමක් යටතේ මෙම කරුණු දෙක අධ්‍යයනය කිරීම ප්‍රායෝගික නොවේ. මෙම ස්විස් චැලේන්ජ් ක්‍රමය යටතේ මූලිකවම ශක්‍යතා අධ්‍යයනය කිරීම කර ඇත. | පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලිය මූලික අධ්‍යයනයට ඇතුලත් නොකර ඒ සඳහා ගෙවීම් කිරීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (vii) | ගිවිසුම ප්‍රකාරව පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාව මාස 4 ක් ඇතුළත සකස් කර අවසන් කල යුතු වුවද 2023 නොවැම්බර් 30 දක්වා අවස්ථා 10 දී වසර 4 කුත් මාස 10 ක කාලයක් සඳහා දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. | ශක්‍යතා අධ්‍යයනය කිරීමේදී සමහර දත්ත පාරිසරික අධ්‍යයනය කිරීමට ගිවිසුම්ගතව සිටි ආයතනයට සැපයීමේදී නිසි කාල සීමාව තුළ ලබා දීමේ ප්‍රමාදයන් සිදුව ඇත. විශේෂයෙන් නැවත පදිංචි කිරීමේ කාර්යයන්හිදී අදාළ භූමිය තෝරා ගැනීම, අනිකුත් රේඛීය ආයතන වලින් අනුමැතිය ලබා ගැනීම, වාර්තා ඉදිරිපත් කර සමාලෝචනය කර සැකසීම වැනි කරුණු වලදී සැලකිය යුතු | පාරිසරික අධ්‍යයනය නිසි කාල සීමාව තුළ ලබා නොදීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රමාදයන් නිසා මෙම ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට සිදුව ඇත. | |
| (viii) | කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතියට අදාළ සාමාජීය ඇගයීම් වාර්තාව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම රු.4,008,750 කට සකස් කිරීම සඳහා 2018 ජූලි 20 දින පුද්ගලික සමාගමක් සමග වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ගිවිසුමකට එළඹ තිබුණි. අදාල වාර්තාව හා සැලැස්ම මාස 3 ක් ඇතුළත එනම් 2018 ඔක්තෝබර් 14 දිනට අවසන් කල යුතු වූ වුවත් 2020 අගෝස්තු 30 දක්වා අවස්ථා 4 කදී අවුරුදු 1 මාස 10 ක් දින දීර්ඝ කර තිබුණි. අදාල ගිවිසුම අනුව පළමු කෙටුම්පත් වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් අනුමත කල පසු ගිවිසුම් ගත වටිනාකමින් සියයට 70 ක මුදලක් ගෙවීමට හැකි වේ. 2019 අප්‍රේල් 02 දින ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් වාර්තාව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියක් ලද බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. එසේ තිබියදී ගිවිසුමට පටහැනිව මුළු ගිවිසුම් වටිනාකමින් සියයට 85 ක් 2018 වර්ෂයේ සිට 2022 දක්වා එනම් රු.3,778,247 ක මුදලක් එනම් ගෙවීම් කර තිබුණි. | සමාජීය ඇගයීම් වාර්තාව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මට අදාල කාර්යසාධන බැඳුම්කරය 2023.05.29 දින තෙක් කාලය දීර්ඝ කර ඇත.එබැවින් බැඳුම්කරය මුදල් කර ගැනීමට අවශ්‍ය නොවේ. | පළමු කෙටුම්පත් වාර්තාව ගෙවීම් කළ හා කාලය දීර්ඝ කිරීම් ලබාදුන් නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකර ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ix) | ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යන වාර්තාව ,පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, සමාජීය ඇගයීම් වාර්තාව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ කටයුතු 2017 ජනවාරි මසට පසු ආරම්භ කර තිබුණද 2017 ජනවාරි 28 දින ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය පවත්වා ඒ වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රු. 22,771,296 ක් වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කිරීමකින්ද තොරව සමාරම්භක උත්සවයක් පවත්වා ඒ වෙනුවෙන් විධිමත් අනුමැතියකින් තොරව වියදම් දරා තිබුණි. | සමාරම්භක උළෙල විෂය භාර ඇමතිතුමා විසින් ගරු ජනාධිපතිතුමා වෙත සිදුකරන ලද ආරාධනයට අනුව පවත්වා ඇත. ගරු ජනාධිපතිතුමා පැමිණෙන බැවින් මෙය ජාතික මට්ටමේ උත්සවයක් ලෙස සංවිධාන කටයුතු සිදු කල යුතුව තිබුණි. ඒ සඳහා විෂය භාර ඇමතිතුමා සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් අවශ්‍ය උපදෙස් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. ඒ අනුව පිළියෙල කරන ලද ඇස්තමේන්තුව අනුමත කර උත්සවයේ කටයුතු සිදු කර ඇත. | ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කිරීමකින් තොරව සමාරම්භක උත්සව වියදම් දරා තිබූ නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකර ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (x) | එකතු කල අගය මත බදු ගෙවීමට ලියාපදිංචි විය යුතු මුළු පිරිවැය 2020 ජනවාරි 01 දින සිට වැඩිකර තිබීම නිසා පුද්ගලික සමාගම 2020 ජනවාරි 01 දින සිට එකතු කල අගය මත බදු (VAT) සඳහා අදාල නොවන ආයතනයක් බවට දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් දන්වා තිබුණි. ඒ පිළිබඳ නොසලකා එම ආයතනය වෙත 2020 වර්ෂය තුලදී රු.160,350 ක් VAT ලෙස ගෙවා තිබුණි. ඉන් රු. 112,245 ක මුදලක් පමණක් නැවත අය කර ගෙන තිබූ අතර එයද ආදායමක් ලෙස ගැනීම වෙනුවට තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා අංක 6000-0-0-13-0-36-0 දරන පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. | මෙහිදී අමතර වශයෙන් ගෙවා තිබූ රු.112,245 ක මුදල අය කර ගෙන තිබුණි. | ලියාපදිංචිය පරික්ෂා කිරීමකින් තොරව එකතු කල අගය මත බදු ගෙවීම් කළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්රියාමාර්ග ගත යුතු අතර අය කල වටිනාකම භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (xi) | ව්‍යාපෘති මූලික ඇගයීම් වාර්තා වන ශක්‍යතා අධ්‍යයන වාර්තාව, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, සමාජ බලපෑම් ඇගයීමේ හා නැවත පදිංචි කිරීමේ සැලැස්ම යන මූලික වාර්තා අනුමත කර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ වූ තෙනගල්ලන්ද සහ ඉත්තෑකටුව වැව් 2හි යටි නිම්න සංවර්ධන කටයුතු ඉටු කිරීමට රු.95,262,039 ක් වියදම් කර තිබුණි. එලෙස සංවර්ධනය කරන ලද තෙනගල්ලන්ද වැවෙහි යටි නිම්න සංවර්ධන කටයුතු වල ගැටළු ලෙස සොරොව්වේ සිට මීටර් 100 ක් දුරට කොන්ක්‍රීට් බේසම සැලසුම් කල පරිදි නිම නොකිරීම,සොරොව්වේ ආවරණය ඉදි නොකිරීම,සොරොව්වේ දොර අරින ග්‍රේඩරය සඳහා G.I බටයක් දැමීම, වැව් බැම්මේ පිඩලි ඇල්ලීම ක්‍රමානුකූලව සිදු නොකිරීම, වැව ඇතුළත එක් පැත්තක පමණක් රොන් මඩ ඉවත් කර වැවෙහි අනෙක් පස රොන් මඩ ඉවත් කර නොතිබීම සහ වැව ප්‍රතිසංස්කරණයෙන් පසු ගොවි සංවිධානය වෙත භාර දී නොතිබීම යන කරුණු නිරීක්ෂණය විය. | සොරොව්ව සඳහා අනුඥාත ඇස්තමේන්තුව තුළ වෙන් වී ඇති 1:2:4 කොන්ක්‍රීට් ප්‍රමාණය 62.4$m^3$ කි. MON/216/54 අංක දරණ මිනුම් පොතේ සඳහන් වැඩ අවසන් කරන ලද කොන්ක්‍රීට් ප්‍රමාණය 25.11$m^3$ වේ,සොරොව්ව ඉදිකිරීමට අදාල අනුඥාත කර ඇති ඇස්තමේන්තුවේ සොරොව්වේ ආවරණය ඉදි කිරීමට අදාළ අයිතමයන් ඇතුළත්ව නොමැත,මෙයට අදාල rod එක සැපයීම ඇස්තමේන්තුවේ අන්තර්ගතව නොමැත. | ව්‍යාපෘතියේ මූලික වාර්තා අනුමත කිරීමට පෙර සංවර්ධන කටයුතු ආරම්භ කිරීම හා දෝෂ සහගත ලෙස ඇස්තමේන්තු සකස් කර අනුඥාත කළ නිළධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (xii) | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2023 මැයි 31 දින ඉදිරිපත් කර තිබූ අංක අමප 23/1028/604/010-I දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2023 මැයි 31 න් පසුව අවසන් කළ යුතු විය. ව්‍යාපෘති කාර්යයන් තවදුරටත් කර ගෙන යාම සඳහා වූ වගකීම මොණරාගල ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය වෙත භාර දීමටත්, ඉඩම් සම්බන්ධයෙන් ප්‍රදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධ වී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් වාරිමාර්ග ලේකම් වෙත නියම කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත පවරා තිබුණද එම පවරා දීමට අදාළ ලිපි ලේඛණ විධිමත් ලෙස සකස් කර නොතිබුණි. | පවරා දීමට අදාල ලේඛණ විධිමත් පරිදි සකස් කර ඇති අතර පවරා දීම විධිමත් පරිදි සිදු කර ඇත. ව්‍යාපෘතිය භාර දුන් දිනට දරා ඇති වියදම පිළිබඳ වර්ගීකරණයක් සහිතව සකස් කරන ලද ව්‍යාපෘතියේ අවසාන ගිණුම,ඉටුකරන ලද එක් එක් කාර්යයන්ට අදාලව දරණ ලද පිරිවැය හා ඒ යටතේ ඉටු කරන ලද කාර්යයන් දැක්වෙන ප්‍රගති වාර්ථාව,ව්‍යාපෘතියට අයත් ස්ථාවර වත්කම් ,ඉන්වෙන්ට්‍රි භාණ්ඩ , ඉතිරිව තිබූ ලිපි ද්‍රව්‍ය හා පාරිභෝගික භාණ්ඩ විධිමත් පරිදි වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය වෙත සහ මොනරාගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය වෙත භාර දීම,ව්‍යාපෘතියට අදාල වාර්තා වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් වෙත භාර දීමේ පිටපතක්, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තැන්පත් කරන ලද මුදල් නැවත ලබා දෙන ලෙසට ප්‍රාදේශය ලේකම්වරුන් වෙත දැනුම් දීමේ ලිපි,ඒ අනුව මැදගම ප්‍රා.ලේකම් විසින් අංක 234918 දරන රු.11,277,500 ක් වටිනා චෙක්පතකින් තැන්පත් කරන ලද මුදල් නැවත ලබා දී | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත පවරා දීමට අදාළ ලිපි ලේඛණ විධිමත් ලෙස සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇත,කාර්යාලීය ලිපි ලේඛණ වියීමත් පරිදි භාර දීම. | |
| (ආ) | කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම | | |
| | 2021-2023 කාලය තුල මිලියන 6,000 ක ඇස්තමේන්තුවක් යටතේ කුඩාවිලච්චිය ජලාශය සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 162.14 ක් වැයකර තිබුණි. මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරනය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ මත මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියයෙන් අපේක්ෂිත ප්‍රතිලාභයන් ලෙස හඳුනාගෙන තිබූ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයින් 25,000 කට පිරිසිදු පානීය ජලය සැපයීම, මහවිලච්චිය මහා වාරි යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1.57 සිට 2.0 දක්වා වැඩි කිරීම, අලි මිනිස් ගැටුම් අවම කිරීම, පුරාවිද්‍යා ස්ථාන තවදුරටත් විනාශ වීමෙන් ආරක්ෂා කිරීම, අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම, විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන සතුන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම සහ මෝදරගම් ආරු ගංගාවේ පාරිසරික තුලනය සඳහා ජල ගලනය සහතික කිරීමට නොහැකිවී තිබුණි. | සඳහන් අදාල කරුණු නිවරැදිය. | සියලු ව්‍යාපෘති පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රමුඛතා හඳුනා ගෙන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුව වෙත ඉදිරිපත් කර යුතුය. |
| (ඇ) | වඩමාරච්චි කළපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරීම මඟින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා 2019 වර්ෂයේදී දේශීය අරමුදල් රු.මිලියන 2,000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ව්‍යාපෘතියක් ආරම්භ කර එම වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව ඇතත් වසර 3කට පසුව 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 28 ක් වැයකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා ව්‍යාපෘති කිහිපයක් යෝජනා වී ඇති අතර මෙය ඉන් එක් ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියට අදාල මූලික අධ්‍යයන කටයුතු සිදු කලද යෝජනා ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීමේදී මෙම ව්‍යාපෘති සඳහා අවම ප්‍රමුඛතාවයක් ලැබීම මත ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කර ගෙන යෑමට නොහැකි වී ඇත. | කාර්යසාධන වාර්තා තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඒ සඳහා හේතු දැක්විය යුතුය. |
| (ඈ) | මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරිමාර්ග සංවර්ධන (වෙල්ලස්ස නවෝදය) ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා අනුඥාත කරනු ලැබූ ඇස්තමේන්තු මඟින් රු.මිලියන 189 ක් වැයකර ආරම්භ කර තිබූ ව්‍යාපෘති 09 ක් අතරමග අත්හැර දමා තිබුණි. | වෙල්ලස්ස නවෝදය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩකටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන් වූ අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022 ඔක්තෝම්බර් 07 වන දිනැති ලිපියට අනුව කටයුතු කර ඇත. මෙම ව්‍යාපෘතියේ සමහර ඉදි කිරීම් නවතා දමා ඇති බැව් පෙනී යන | කාර්යසාධන වාර්තාවට ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඒ සඳහා හේතු දැක්විය යුතුය. ප්‍රතිපාදන සීමාව ඉක්මවා ඇස්තමේන්තු අනුඥාත කළ නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | | අතර ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරමි. | සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | දලුග්ගල වැව භූ විද්‍යා පරීක්ෂණ සඳහා 2022 වර්ෂය තුළ රු.3,190,000 ක ඇස්තමේන්තුවක් අනුඥාත කොට වැයකර තිබුණද, එම වැව ඉදිකිරීමට අදාළ මූලික කටයුතු කිසිවක් ආරම්භ කිරීමකින් තොරව අතර මග නවතා තිබීම හේතුවෙන් දරා තිබූ වියදම ආනාර්ථික වී තිබුණි. | ඒ සම්බන්ධව විස්තර ලබාදෙන ලෙස දන්වා ඇත. | කාර්යසාධන වාර්තා තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතුය. |
| (ඊ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශය මගින් ශක්‍යතා අධ්‍යන සිදුකර තිබූ ව්‍යාපෘති 13 ක් එනම් පෙතියාගොඩ පිහිටි පොම්පාගාරය ඉදිකිරීම, කැකිරියෝබඩ අතිරේක පිටවාන ඉදිකිරීම,කැලණි ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රමයේ නිකවේල හි ගංවතුර පිටවීමේ ව්‍යුහය ඉදිකිරීම,මයියාව වැවේ පිටවාන වැඩිදියුණු කිරීම,මල්වතුඔය හරහා RCC පාලම ඉදිකිරීම,පෙරාරු අමුණ ඉදිකිරීම,කුඩාවිලච්චිය 2024 මැයි 31 දක්වා ආරම්භ කිරීමට කටයුතු කර නොතිබූ අතර ඒ වෙනුවෙන් දරනු ලැබූ වියදම හඳුනාගත හැකිවන පරිදි ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. | පෙතියාගොඩ පොම්පාගාරය - පිරිවැය වැඩිවීම හේතුවෙන් නැවත කැබිනට් අනුමැතියට ඉදිරිපත් කර ඇත.කැකිරිඔබඩ ව්‍යාපෘතිය අතිරේක පිටවාන ඉදිකිරීම ජල සම්පත් මණ්ඩලයේ ප්‍රතිපාදන මත ඉදිකිරීමට අපේක්ෂාවෙන් ඉදිකිරීම් ආරම්භ කර නැත.කැළණි ගඟ ඉදිරියේදී ප්‍රතිපාදන ලැබීම මත සිදු කිරීම අපේක්ෂා කෙරේ.මයියාව වැව පිටවාන වැඩදියුණු කිරීම මේ වන විට සම්පූර්ණ කර ඇත.RCC පාලම ඉදි කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක අතර ඉදිරියේදී ප්‍රතිපාදන ලැබෙන අකාරයට ඉදිකිරීම අපේක්ෂිතය.<br>කුඩාවිලච්චිය නවතා ඇත.<br>ඇල්ලේ වැව ඉදිකරමින් පවතී.<br>එළුවන්කුලම අමුණ සැලසුම් කර ඇත. ප්‍රතිපාදන ලැබුනු පසු ආරම්භ කල හැක.<br>විලලෝඩය අමුණ සැලසුම් කර ඇත.ප්‍රතිපාදන ලැබුණ පසු ඉටුකල හැක.මල්වතුඔය පිටවාන ටෙන්ඩර් කැඳවා ඇත.ප්‍රතිපාදන ලැබුණ පසු ඉටු කල හැක. | ව්‍යාපෘති පිරිවැය හා ඉටු කරනු ලැබූ කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවන් සකස් කර වගකිවයුතු බලධාරීන් වෙත යොමු කළ යුතුය. ප්‍රමුඛතා පදනම මත ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ගම සමඟ පිළිසඳරක් වැඩසටහන | | |
| (i) | ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ ගොවි ව්‍යාපාරවල ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 116 ක් ඇස්තමේන්තු කර ඉන් රු.මිලියන 31.2 ක් වැයකර තිබුණි. නියමිත අනුමත කිරීමේ පටිපාටීන් අනුගමනය කිරීමකින් තොරව ආරම්භ කර තිබූ උක්ත ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ ප්‍රතිපාදන ලැබී නොතිබුණු අතර අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකිව අතරමග නවතා තිබීම හේතුවෙන් දරන ලද පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි. | ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතියේ පදවිය හා වාහල්කඩ ව්‍යාපාර වල ඇළ පද්ධති වැඩිදියුණු කිරීම යෝජනා වී තිබුණි.මෙය යටතේ අඟල් 4-6 ප්‍රමාණයේ බට යොදා ගෙන කුඹුරු වලට වතුර ගැනීමට සැලසුම් කල අතර ඊට අදාලව කුඩා කොන්ක්‍රීට් පයිප්ප බට 2,411 ක් රු.මිලියන 31.2ක් වැය කොට මිලදී ගෙන මේවන විට ගොවි සංවිධාන වෙත සපයා කාර්යන් ඉටු | විධිමත් අනුමැතීන් මත කටයුතු කළ යුතු අතර, දරන ලද පිරිවැයට අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට අත්වන පරිදි ව්‍යාපෘතියේ වැඩ |

| | | | |
|---|---|---|---|
| | | කිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතියට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අදාලව අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ වගාබිම් සඳහා ජල සැපයුම් ඉදිකිරීමට සැලසුම්කර ඒ සඳහා අවශ්‍ය හීයුම් පයිප්ප 2411 ක් මිලදී ගෙන තිබූ අතර ඉන් 1,245 ක් ගොවි සංවිධාන වෙත නිකුත් කර තිබුණද එමගින් අපේක්ෂිත ජල සැපයුම් ඉදිකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හීයුම් පයිප්ප 1,166 ක් පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව තබා තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා පසුකාලීනව ප්‍රතිපාදන නොලැබූ නිසා ඊට අදාල ඉතිරි වැඩ කිරීමට නොහැකි විය. මේ සඳහා විකල්පයක් නොවූ බැවින් එම බට 1592 ක් ගොවි සංවිධාන වෙත ලබා දී ඒවා ක්ෂේත්‍රයේ ජල සැපයුම් කටයුතු සඳහා යොදා ගෙන ඇත. ඉතිරි බට ද ඉදිරි කාල වලදී ගොවි සංවිධාන වෙත දී අවශ්‍ය ජල සැපයුම් යාවත්කාලීන කිරීමට සැලසුම් කර ඇත. | මිලදී ගත් හීයුම් පයිප්ප සැලසුම් කළ පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක, ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 128,942 ක් වූ සංවර්ධන ව්‍යාපෘතීන් 9 ක සැලසුම් කළ කාලය ඉක්මවා තිබුණද නිමකර නොතිබුණි. 2012 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ එම ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවන් කිහිපයකදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති අරමුණු යටතේ හඳුනාගෙන තිබූ වාසි සැලසුම්ගත පරිදි ලබාගැනීමට නොහැකි වී තිබුණි. ඒ පිළිබඳ විශ්ලේෂණයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරද නොතිබුණි. | කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය - RAMP කමිටු තීරණය අනුව වැඩ නවතා ඇත. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය - කුඹුරු ඉඩම් ලබාදීමේ හා අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු 2024 වර්ෂය තුල නිම කිරීමට අපේක්ෂා කෙරේ. ඉඩම් සඳහා වන්දි ගෙවීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී,මොරාණ ජලාශ ව්‍යාපෘතිය - ඉඩම් සඳහා වන්දි ගෙවීම් කටයුතු සිදුකරමින් පවතී,මුන්දෙණිආරු ව්‍යාපෘතිය - AFD ණය ගිවිසුම අනුමත වී නොමැත. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී, වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය - RAMP කමිටු තීරණය අනුව නතර කර ඇත, උමා ඔය ව්‍යාපෘතිය - ව්‍යාපෘතියේ වැඩ සියයට 90 ක් පමණ නිමකර ඇති අතර 2024 වර්ෂය අවසානයේ වැඩ කටයුතු නිමකිරීමට අපේක්ෂා කෙරේ, මහගල්ගමුව පෝෂිත ඇල ඇතැම් ඉදිකිරීම් මග නවතා ඇත. ගොඩිගමුව ව්‍යාපෘතිය - ඇස්තමේන්තු සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | මේ පිළිබඳ ප්‍රමාණවත් විශ්ලේෂණයක් සිදුකර අමාත්‍යමණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. |

(ආ) උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිකුත්කළ කාර්යසාධන වාර්තාව අනුව මෙහි සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 15,130.40 ක් වී තිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභයන් වූ නව ඉඩම් හෙක්ටයාර 4,500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1,500 කට වාරි ජල පහසුකම් සපයා දීමට සැලසුම් කලද මේ දක්වා නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 750 ක් පමණක් වගාකිරීමට වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම්කර තිබූ හෙක්ටයාර් 5,250 ක් හෙවත් සියයට 87.5 සඳහා ජලය නිකුත්කර නොතිබුණි. එසේම මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම, සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය, නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම හා කුඩා වැව් 54 ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110 කට ජලය සැපයීමේ අරමුණු ව්‍යාපෘතිය ආරම්භ කර වසර 11 ක් ගතවී තිබූ නමුත් මේ දක්වා ලගාකරගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභයන් කොටස් වශයෙන් ලැබෙමින් පවතී. ව්‍යාපෘතිය යටතේ වගා කරන ප්‍රදේශ මේවන විට හඳුනා ගෙන ඒවා සිතියම්ගත කිරීම කරගෙන යනු ලබයි. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ හා 2022 ඔක්තොම්බර් 07 වන දිනැති ලිපියට අනුව ව්‍යාපෘතියේ හඳුනා ගත් අත්‍යවශ්‍ය වැඩ සඳහා පමණක් ප්‍රමුඛතාවය දී මෙම වසරේ අවසන් කිරීමට උපදෙස් දී ඇත. කුඩා වැව් 110න් වැව් 65ක් පුනරුත්තාපනය කිරීම සඳහා තෝරා ගෙන ඇත. ඉන් 58ක් මේ වන විට පුනුරුත්තාපනය කර ඇත. | අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති කඩිනමින් නිමකිරීමටත් වාරි පහසුම්කම් සපයනු ලබන නව කුඹුරු ඉඩම් හා පැවති කුඹුරු ඉඩම් වෙන්වෙන්ව හඳුනාගත හැකි පරිදි ලේඛන සකස්කළ යුතුය. |
| (ii) | ජල විදුලි උත්පාදනයෙන් පසු නිකුත් කරන ජලය කිරිදි ඔය ද්‍රෝණියේ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමට අදාළ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබුණු වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ සඳහා 2009 වර්ෂය සිට නියෝජ්‍ය ව්‍යපෘති අධ්‍යක්ෂකවරයෙකු යටතේ අලිකොටආර ජලාශයේ සිට කිලොමීටර් 18 ක් දුරින් පිහිටි මීගස් ආර වැව හරහා ගෙනයනු ලබන ජලය කිලෝමීටර් 24+365 දුරින් පිහිටි කුඩාඔය ජලාශයට ගෙනයාමෙන් පසු ප්‍රියන්තගේ වැව දක්වා ගෙනයාමට සැලසුම්කර තිබුණි. එසේ වුවද මීගස් ආර වැව දක්වා ජලය ගෙනයාමට හැකි පරිදි පහල නිම්න සංවර්ධන කටයුතු නිම කර නොතිබීම හේතුවෙන් අලිකොටආර ජලාශයෙන් නිකුත් කරන ජලය මීගස්ආර වැව දක්වා ගෙන යාමට නොහැකිවී තිබුණි. | බුදුරුවගල නිර්මිතය නිම වූ පසු මීගස්ආර වැව දක්වා ජලය ගෙන යෑමට හැකිය. ඇල මාර්ගය සැකසීමේදී ඉඩම් අත්පත් කර ගැනීම්, ලැබෙන ප්‍රතිපාදන සීමා සහිත වීම්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ගස් ඉවත් කර ගැනීම්, වෙනත් තාක්ෂණිකමය ගැටළු නිසා මෙම ඉදිකිරීම් කටයුතු වලට බාධා එල්ල වී තිබුණි. නමුත් මේ වන විට ප්‍රධාන ඇලෙහි ඉදිකිරීම් කඩිනමින් සිදු වන අතර එම කාර්යයන් ඉදිරි මාස කිහිපය තුල නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව මීගස් ආර වැවට ජලය සැපයෙනු ඇත. | මූලික සැලසුමට අනුව ව්‍යාපෘති කටයුතු නිමකර අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි වාරි පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ප්‍රියන්තගේ වැවේ සිට කිලෝමීටර් 5.5 ක් දුරින් පිහිටි කෙඩුම්කඩේ වැව දක්වා ඇති මලල ආර සංවර්ධනය කිරීමත් ඉන්පසු බඳගිරිය හා පහල මත්තල දක්වා ඇති වැව් 40 කට ජලය රැගෙන යාමටත් සැලසුම්කර තිබුණි. එහෙත් ප්‍රියන්තගේ වැවෙන් පසුව ජලය ගෙන යාමට හැකිවන පරිදී ඇල මාර්ග සංවර්ධනයට මේ දක්වා කටයුතු කර නොතිබුණි. දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන් මේ දක්වා නිම කර නොතිබීම හේතුවෙන් උමා ඔය ද්‍රෝණියේ ජලය කිරිදි ඔය ද්‍රෝණියට හැරවීමේ ප්‍රධාන | මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ හා 2022 ඔක්තෝබර් 07 වන දිනැති ලිපියට අනුව ව්‍යාපෘතියේ හඳුනා ගත් අත්‍යවශ්‍ය වැඩ සඳහා පමණක් ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමට සිදුව ඇත. කෙසේ වුවද කිරිදිඔය ද්‍රෝණියට ජලය සැපයීම අවශ්‍ය වන්නේ නම් අලිකොටආර ජලාශය පිහිටා | මූලික සැලසුමට අනුව ඇලමාර්ග සංවර්ධනය කර අපේක්ෂිත පරිදි බඳගිරිය හා පහල මත්තල දක්වා ඇති වැව් 40 කට ජලය සැපයිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුණ වූ දකුණු පළාතේ පිහිටි ඉඩම් සඳහා ජලය සැපයීමට නොහැකි වී තිබුණි. | තිබෙන්නේ කිරිදිඹයේ අතු ගංගාවක් හරහා නිසා එම කාර්යය අලිකොටආර ජලාශයේ සිටම පහසුවෙන් කල හැක. | |
| (iv) | උමා ඔය පහල නිම්න සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය ඒ යටතේ පාලනය වන කුඩාඔය, සිංහලයාගම, හඳපානාගල හා වැල්ලවාය නේවාසික ව්‍යාපාර ඉංජිනේරු කාර්යාල 4 ක් සහ ව්‍යාපෘතියට අනුයුක්ත ස්ථිර කාර්ය මණ්ඩලයක් සහිතව ව්‍යාපෘතියේ කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. නමුත් ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම යන කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා අවශ්‍ය කළමනාකරණ තීරණ ගැනීමට වැදගත් තොරතුරු ලේඛනයක් හෝ යාවත්කාලීන කරන ලද පරිඝණක ගත තොරතුරු පද්ධතියක් පවතවාගෙන ගොස් නොතිබුණි. ඒ හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති නිර්ණායකයන්ට අනුකූලව නිසි පුද්ගලයින් වෙත සිදුකර ඇතිබව විගණනයේදී තහවුරු කළ නොහැකි විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ සියළුම කටයුතු ව්‍යාපෘති ආරම්භයේ සිටම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරයි. උමා ඔය පහළ නිම්න ව්‍යාපෘති කාර්යාලය මඟින් සිදු කරනු ලබන්නේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට සහය විම පමණි. ඉඩම් සම්බන්ධ සියළුම ලිපි ගොනු ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය සතුව පැවතිය යුතුය. | ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම යන කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා අවශ්‍ය කළමනාකරණ තීරණ ගැනීමට වැදගත් තොරතුරු ලේඛනයක් හෝ යාවත්කාලීන කරන ලද පරිඝණක ගත තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (v) | ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් යුත් ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරි සීමාවට සරිලන පරිදි රු. මිලියන 50 බැගින් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු කොටස්කර අනුමත කර සැලසුමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය සඳහා අනුමත ඇස්තමේන්තුවක් ඇත. හඳුනාගත් වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර අනුමත සීමාවන් තුල එම කාර්යය සෘජු ශ්‍රමය උපයෝගී කරගෙන ඉටු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව කටයුතු කළ නිළධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (vi) | උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ රු.මිලියන 9,352.5 ක ඇස්තමේන්තුව යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන්ට අදාල උප කාර්යයන් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබූ අතර එක් එක් උප කාර්යයන් යටතේ වූ ප්‍රතිපාදන වැය කිරීමට ඇස්තමේන්තු අනුඥාත කිරීමේදී විධිමත් ලේඛන නඩත්තු කරද නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ අදාල කාල සීමාව තුල ඉටුකරන ලද කාර්යයන් හා ඒ සඳහා දරන ලද වියදම් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි විය. | අදාල වර්ෂය තුල ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රධාන ඇස්තමේන්තුවේ උප විෂයන් සඳහා වෙන වෙනම ප්‍රතිපාදන ලබා දෙන ලදී. ක්ෂේත්‍රයේදී එම උප විෂයන් යටතේ ඇස්තමේන්තු සකසා ඒවා අනුඥාත කර දෙන ලද ප්‍රතිපාදන කොටස් වශයෙන් එම ඇස්තමේන්තු සඳහා වෙන් කර ගනු ලබයි. මෙම උප ඇස්තමේන්තු යටතේ ඇති අයිතමයන් සඳහා එම ප්‍රමාණයන් නොඉක්මවන පරිදි ක්ෂේත්‍රයේ කටයුතු කරගෙන යනු ලබයි. මෙම සියල්ල සඳහා අදාල ලිපි ලේඛණ වෙන වෙනම පවත්වා ගෙන යනු ලබයි. එසේම දරනු ලබන වියදම් ඇස්තමේන්තු ගත අයිතමයන් නොඉක්මවන පරිදි පවත්වාගෙන යෑම කරගෙන යනු ලබයි. | ව්‍යාපෘතිය යටතේ ඉටුකරන ලද කාර්යයන් හා දරන ලද වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි ලේඛන සකස්කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vii) | උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 14,945.28 ක් වැයකර තිබූ නමුත් ප්‍රමුඛතා හඳුනාගෙන නිසි සැලැස්මකට අනුකූලව ඉදිකිරීම ආරම්භ නොකිරීම හේතුවෙන් නිමකළ ඇළ මාර්ග සේදී යාම, ඉවුරු ඛාදනය, ඇළ මාර්ගවල හා කොන්ක්‍රීට් නිර්මිත තුළ පස් පිරීම ආදිය යථාවත් කිරීම සඳහා අමතර ප්‍රතිපාදන දැරීමට සිදුව තිබුණි. | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ වන විට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ හා 2022 ඔක්තෝබර් 07 වන දිනැති ලිපියට අනුව දී ඇති උපදෙස් අනුව කටයුතු කරගෙන යනු ලබයි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය වැඩ කටයුතු 2024 වසරේ නිම කිරීමට නියමිතය. සමහර ගැටළු හේතුවෙන් වැඩ නතර කිරීම් හා නැවත ආරම්භ කිරීම් වලට මුහුණ දීමට සිදු වූ අවස්ථාවන් හිදි නැවත වැඩ ආරම්භ කරන විට ක්ෂේත්‍රයේ ඉදි කිරීම් අත්හිටුවා තිබූ සමහර වැඩ කොටස් නැවත සකස් කර ගැනීමට වූ අවස්ථා ද ඇත. | ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය හඳුනාගෙන ඉදිකිරීම් කළ යුතු අතර. නිමකළ ඇළ මාර්ග සේදී යාම, ඉවුරු ඛාදනය, ඇළ මාර්ගවල හා කොන්ක්‍රීට් නිර්මිත තුළ පස් පිරීම වැලැක්වීමට කටයුතු කළ යුතුය. |
| (viii) | 2022 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. එසේ වුවත් ඒ සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති කාර්යාලය විසින් භාවිතා කරන ලද උපකරණ භාර ගැනීම සම්බන්ධ සකස් කර ඇති වාර්තාවල පිටපත්, භාර ගන්නා දින වන විට නිමකර ඇති කාර්යයන් පිළිබඳ කාර්යසාධන හෝ ප්‍රගති වාර්තාවල පිටපත්, ව්‍යාපෘතිය භාරගත් දින වන විට දරා ඇති වියදම් පිළිබඳ විස්තර ඇතුළත් කර ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තාවල පිටපත් සහ ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දිනට නිමකිරීම සඳහා යොදාගනු ලබන වැඩ නිමකිරීමේ සැලැස්ම ආදිය ඉදිරිපත්කර නොතිබුණි. | විගණන වාර්තාවේ සඳහන් සමහර කරුණු නිවැරදියි. ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයෙන් භාර දෙන බඩු භාණ්ඩ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයෙන් භාර ගෙන ඇත. ව්‍යාපෘතිය භාර ගන්නා අවස්ථාවේදී කරන ලද කාර්යයන් පිළිබඳ වාර්තා හා ඒ වන විට දරා ඇති වියදම් පිළිබඳ සවිස්තරාත්මක විස්තර ලිඛිතව ලැබී නොමැත. ව්‍යාපෘතිය 2022 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාර ගැනීමෙන් පසු 2024 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අදාල සැළසුම් ඇත. | ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරීමේ ලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 3.5 විදේශ ආධාර ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීමේ බහු අදියර ව්‍යාපෘතිය (CResMPA) සඳහා එළඹ තිබූ 2021 සැප්තැම්බර් 17 දිනැති ගිවිසුම 2023 මැයි 23 වන දින නැවත සංශෝධනය කර තිබුණි. ඒ අනුව දිළිඳු ප්‍රජාවට ඔවුන්ගේ ඇළ මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට සහාය වෙමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට උපකාර කිරීමේ අරමුණින් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරීමට තීරණය කර තිබුණි. ව්‍යාපෘති සංරචක 1 සහ 2 සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු. මිලියන 4,500 (ඇ.ඩොලර් මිලියන 15) ක් වෙන්කර "දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ වාරිමාර්ග හා වැසි ජලය යටිතල පහසුකම් නඩත්තු කිරීම" ලෙස 5 වන සංරචකය | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ගොවි සංවිධාන වෙත පිරිනමන ලද කොන්ත්‍රාතු දෙපාර්තමේන්තු නිළධාරින් විසින් ඉටු නොකල යුතුය. |

හඳුනාගෙන තිබුණි. මෙම නව සංරචකය මගින් දිස්ත්‍රික්ක 25 හි වාරිමාර්ග පද්ධති වල බෝක්කු, ගංවතුර පාලන ව්‍යුහ, ගේට්ටු සහ ජල මෙවලම්, හදිසි අලුත්වැඩියාවන් සිදුකිරීමට සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ක්‍රියාත්මක කර තිබුණි.

ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඇස්තමේන්තු වටිනාකම රු. 87,421,384 ක් වූ කොන්ත්‍රාත් පැකේජ 69 ක් ගොවි සංවිධාන වෙත පිරිනමා තිබුණි. ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 30.755 වූ කොන්ත්‍රාත් පැකේජ් 17 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් මඩකලපුව හා අම්පාර ප්‍රදේශවල සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණ අනුව එම ඉදිකිරීම් බොහොමයක් ගොවි සංවිධාන මගින් සිදුකර නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින්ම සිදුකළ බව තෙවන පාර්ශව විගණනයට තහවුරු කරන ලදි. එමගින් මෙම සංරචකය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වූ " දිළිඳු ප්‍රජාවට ඔවුන්ගේ ඇළ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට සහාය වෙමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට උපකාරී වීම" යන අරමුණ ඉටු වී නොතිබුණි. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණයේ අධීක්‍ෂණය ද අවම මට්ටමක පැවතුණි.

## 3.6 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 11 ක් මගින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත හා නඩත්තු වැඩ සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත්කරණ ලද තොරතුරු අනුව රු.මිලියන 978 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 137 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්ත අතරින් රු.මිලියන 446 ක් වටිනාකමින් යුත් කර්මාන්ත 28 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාර ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබුණි. එසේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත හා නඩත්තු වැඩවලට අදාළව පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාරව ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය සුදුසු වන්නේ තම ආයතනයේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා ප්‍රමාණවත් යන්ත්‍ර සූත්‍ර පවතී නම් පමණක් වුවද ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා යන්ත්‍ර සූත්‍ර පවතින බව තහවුරු කිරීමකින් තොරව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ක්‍රියාත්මක කරන්නේ පවතින වාරිමාර්ග ව්‍යාපාරවල මෙහෙයුම් හා නඩත්තු වැඩ හා ප්‍රතිසංස්කරණ වැඩය. යල මහ දෙකන්නයම වගා කටයුතු අත්හිටුවීමකින් තොරව මේවා | ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට |

| | | | |
|---|---|---|---|
| | කාර්යාල 11 ක් විසින් ඒවායේ ක්‍රියාත්මක කර්මාන්ත වලින් සියයට 20 ක් ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබුණි. | ක්‍රියාත්මක කිරීමට සිදුවේ. බොහෝ විට කන්න අතරතුර ජලය නිකුත් නොකරන කාලසීමාව තුල (මාස දෙකක් වැනි කාලයක් තුල) නඩත්තු වැඩ බොහෝ විට සිදුකල යුතුය. මෙම වැඩ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රවාහනය යන්ත්‍ර සූත්‍ර දුෂ්කර මාර්ග ඔස්සේ වැව් අමුණු කරා ලඟා කරවීම ගොවිතැන් කටයුතු කරන කාලසීමාවේදී අති දුෂ්කරය. | අනුමැතිය ලබාදීමට ප්‍රථම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට ඇති අනුකූලතාවය තහවුරු කර ගත යුතුය. |
| (ii) | මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ශ්‍රමය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත කම්කරුවන් මගින් සපයාගත නොහැකි අවස්ථා වලදී පමණක් බාහිරින් සපයා ගතයුතු වුවත් සියළු පුහුණු හා නුපුහුණු ශ්‍රම අවශ්‍යතා ශ්‍රම සැපයුම්කරුවන්ගෙන්, ගොවි සංවිධාන මගින් හෝ තනි පුද්ගල කම්කරු ගිවිසුම් යටතේ සපයාගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාරව ස්වකීය සේවකයන් උපකරණ ප්‍රමාණවත් පරිදි පවතීනම් පමණක් යන්න නිවැරදි නොවේ.එනම් අදාල වැඩ සඳහා ප්‍රමාණයන් ගැනීම දුෂ්කර වීම (ජල ගැලීම්, මිනිස් හා සත්ව ක්‍රියාකාරකම්),කොන්ත්‍රාත්කරුවන් ට සාධාරණ මිල ගණන් වලට ලංසු ඉදිරිපත් කිරීමට නොහැකි වීම,අදාල කෙරීගෙන යන වැඩ වලට බාධා නොවන ලෙස කිරීමට අවශ්‍ය විට (යල මහ කන්න වලට ජලය සපයමින් පුනරුත්ථාපන,මෙහෙයුම් හා නඩත්තු වැඩ සිදුකිරීමට සිදුවීම),හදිසි අවස්ථාවලදි ඒ සඳහා අවධානය යොමු කිරීමට සිදුවීම. | සෘජුශ්‍රම පදනම මත සිදු වන අවිධිමත්භාවය, ශ්‍රමය සපයා ගැනීම, සේවයේ යොදවා ගැනීම හා ගෙවීම් සහතික කිරීම යන කරුණු වලදී අභ්‍යන්තර පාලනය ශක්තිමත් වන අකාරයට චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. |
| (iii) | මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ශ්‍රමය සපයා ගැනීමේදී අනුගමනය කළ යුතු පටිපාටින්, ඒ සඳහා භාවිතා කළ යුතු ගිවිසුම් ආකෘතින්, පැමිණීම පිටවීම හා කාර්යන් ඉටු කිරීම සම්බන්ධව පවත්වාගත යුතු ලේඛන, ගෙවීම් සිදුකරන පදනම අදී කරුණු පිළිබඳ පොදු උපදෙස් හා නිර්ණායක නිකුත්කර නොතිබුණි. මේ හේතුවෙන් එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් එම කටයුතු අවිධිමත් ලෙස සිදුකරමින් පැවතුණි. | මිනිසි ශ්‍රමය හා යන්ත්‍රෝපකරණ අවශ්‍ය අවස්ථාවලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් බාහිර පාර්ශව වෙතින් ලබා ගනු ලැබේ. | සෘජු ශ්‍රම පදනම මත අවිධිමත්භාවයන් වැළකෙන පරිදි අනුගමනය කළ යුතු පටිපාටීන් හා භාවිතා කළ යුතු ලේඛන හඳුන්වා දෙමින් අභ්‍යන්තර පාලනය ශක්තිම කළ යුතුය. |
| (iv) | මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා දෙපාර්තමේන්තුව සතුව පවතින යන්ත්‍රෝපකරණ මගින් අදාල සේවා ලබාගත නොහැකි විටදී පමණක් අවශ්‍ය යන්ත්‍රෝපකරන බාහිරින් සපයාගත යුතු බවට නියම කර නොතිබුණි. දෙපාර්තමේන්තුව සතුව පවතින 350 ක් පමණ වූ යන්ත්‍රෝපකරණ ඇණිය තුල ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍රෝපකරණ නිෂ්කාර්යව පැවතියදී බාහිර සැපයුම්කරුවන් වෙතින් කුලි පදනම මත යන්ත්‍රෝපකරණ සපයාගෙන තිබුණි. | දෙපාර්තමේන්තුව සතුව පවතින ක්‍රියාකාරී තත්ත්වයේ ඇති යන්ත්‍ර සූත්‍ර ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාල 52 ටම වෙන් කරන ලද ඒවා නොවේ.2021,2022,2023 වසර වල අපවෙත ලබාදුන් විගණන වාර්තා අනුව ප්‍රා.වා.කාර්යාලවල සෘජු ශ්‍රමය යටතේ සිදු කරන ලද වැඩ සංඛ්‍යා පිලිවෙලින් 755 (කලාප කාර්යල 09 ක ලද තොරතුරු අනුව) 776 | දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍ර සූත්‍ර පවතින අවස්ථාවන්හිදී බාහිරින් කුලී පදනම මත යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීම සිදු නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| | (කලාප කායීල 10ක ලද තොරතුරු අනුව) හා 28 (කලාප කායීල 03 ක ලද තොරතුරු අනුව) කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කායීල 14 හි ඇති සියලුම ප්‍රාදේශීය වාරිමාර්ග කායීලවල දහස් ගණන් ප්‍රතිසංස්කරණ හා මෙහෙයුම් හා නඩත්තු වැඩ ඉහත දක්වා අති පරිදි කෙටි කාලයකින් නිමකල යුතු වන බැවින් ඒ සඳහා යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීමට ගතවන කාලය,වැයවන මුදල් ප්‍රමාණය,ප්‍රවාහන දුශ්කරතා සලකා බලා අවශ්‍ය පරිදි දෙපාර්තමේන්තු යන්ත්‍රොපකරණ හා බාහිරව සපයා ගනු ලබන යන්ත්‍ර යොදවා එම කායීන් ඉටු කරනු ලබයි. | |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර යාවත්කාලීන කළ යුතු අතර ඒ තුළ ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කර තිබිය යුතු වේ. මාර්ගෝපදේශ 4.2.3(ඇ) අනුව ප්‍රසම්පාදන කාල සටහන අදාළ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු වුවත් විගණනයට ඉදිරිපත්කළ තොරතුරු අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 11 ක් මගින් 2023 වර්ෂය තුළ සිදු කරන ලද රු.මිලියන 978 ක් වූ ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්ත 137 ක ප්‍රසම්පාදන ක්‍රමවේදය ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් නිශ්චය කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නැත. | ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.7 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(අ) මෝටර් වාහන** | | |
| (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණද දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනය අනුව වාහන සංඛ්‍යාව 1,560 ක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව වාහන 464 ක් දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතුණි. | ලියාපදිංචි වී ඇති 2004 ක් වන මුලු වාහන ලැයිස්තුව දෙපාර්තමේන්තුව සතුව දැනට පරිහරණය කරනු ලබන 994,දෙපාර්තමේන්තුවටඅයත් නොවන බවට කරගත් වාහන තහවුරු 38,අපහරණ ක්‍රියාවලිය මගින් බාහිර පාර්ශවයන් වෙත විකුණා ඇති වාහන 429,MTA 6 මඟින් පවරා දීමට කටයුතු කල වාහන 29,දෙපාර්තමේන්තුවට අයත් නමුත් බාහිර ආයතන වෙත ඇති බව / ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දුන් වාහන 38,වෙනත් අමාත්‍යාංශ පුද්ගලයන් වෙත පවරා දී ඇතත් මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී ඇති නමුත් දෙපාර්තමේන්තුව භාරයේ නොපවතින වාහන පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තුල ඇති දත්ත පද්ධතිය යාවත්කාලීන නොවීම මත තව දුරටත් දෙපාර්තමේන්තුව නමින් පවතින වාහන 08,දෙපාර්තමේන්තුව තුල ගර්හිත ලෙස පවතින වාහන 02,ත්‍රස්තවාදීන් විසින් විනාශ කල වාහන 02,ලිපි ගොනු සොයාගත නොහැකි වීම මත තහවුරු කර ගත නොහැකි වූ වාහන 464 මෑත කාලය තුල වාහන පවරා ගැනීම සඳහා ඉල්ලුම් ලැබී ඇත. | |
| (ii) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 6111 යටතේ ප්‍රවාහන උපකරණ 1220 ක වටිනාකම රු 4,387,145,359 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ඉතිරි වාහන 784 හි වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම නිවැරදි බවට විගණනයේදී පිළිගත නොහැකිවිය. | වාහන තක්සේරු කිරීම සඳහා 2019 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුවරු දෙදෙනෙක් හා අධ්‍යක්ෂවරයෙකු ගෙන් සමන්විත කමිටුව මඟින් ලබා ගත් තොරතුරු මත පදනම්ව වාහන පිළිබඳ තොරතුරු CIGAS ගිණුම් පද්ධතිය වෙත වාර්තා කර ඇත. 1,220 කින් යුත් වාහන ලැයිස්තුව අප විසින් විගණනයට ඉදිරිපත් කර ඇත. තොරතුරු වේ. ඒ අනුව 2019 වර්ෂයේදී වාර්තා කළ වාහන ලැයිස්තුවේ මේ වන විට අඩුපාඩු පවතී. 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු භෞතිකමය වශයෙන් පවතින වාහන සංඛ්‍යාව 1,159ක් බව යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ සහිතව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත 2024 මාර්තු 25 වන දින වාර්තා කර ඇත. භෞතිකව වාහන වල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයේ යාන්ත්‍රික අංශයන් හා කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරු වෙත ලිපි යොමු කළ අතර අදාළ තොරතුරු ලද විගස දත්ත පද්ධතිය වෙත වෙනස්කම් සිදු කිරිමට අපේක්ෂිතය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර තොරතුරු ට තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දිය යුතුය. |
| (iiii) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් හා පරිහරණය කරනු ලබන බවට වාහන ලේඛනයෙහි ඇතුළත් වාහන 1220 ක් අතරින්, වාහන 48 ක් බාහිර පාර්ශව නමින් ලියාපදිංචි වී තිබුණි. එකී වාහනවල අයිතිය මේ දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | බාහිර පාර්ශව නමින් ලියපදිංචි වී යැයි සඳහන් වාහන 48 අතරින් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ට අයත් වාහන 20 ක්ද, දිස්ත්‍රික් ලේකම් ගාල්ල වෙත අයිතිය තිබූ 252-9813 හා 252-9816 යන වාහන දෙකද වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. උමාඔය ව්‍යාපෘතිය වෙත වෙනත් ආයතන විසින් ලබා දී ඇති වාහන 07ක් පවරාගැනීම පිළිබඳව තීරණය ව්‍යාපෘතිය අවසානයේ ගැනීමට නියමිත වේ. උමා ඔය ව්‍යාපෘතිය යටතේ වාරිමාර්ග හා ජල සම්පත් | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය.<br>දෙපාර්තමේන්තුව පරිහරණය කරනු ලබන බාහිර පාර්ශවයන්ට අයත් වාහන වල ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් නමින් මිලදී ගෙන ඇති කැබ් රථ 08 ක අයිතිය එම ව්‍යාපෘතිය අවසානයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට නියමිත වේ. අනෙකුත් වාහන පවරා ගැනීමට නියමිත වේ. | |
| (iv) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ ලියාපදිංචි වී වාහන 2004 ලියාපදිංචි කිරීමේ සහතිකපත් හා අදාළ ආදායම් බලපත්‍ර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය භාර නිලධාරියා සතුව ක්‍රමානුකූලව පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද එම වාහන දැනට භාවිතාකරනු ලබන ස්ථානය හා භාරකාරිත්වය පැවරී ඇති නිලධාරියා සම්බන්ධ විස්තරද යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු වාහනවල ලියාපදිංචි සහතිකපත් පිළිබඳ විස්තර ලැයිස්තුගත කර ඇති අතර නිලධාරියාගෙන් නිලධාරියාට භාර දීමේදී ක්‍රමානුකූලව භාර දීමේ ක්‍රමවේදයක් මේ වන විට සකස් කර ඇත. ඒවා ක්‍රමානුකූලව ලේඛන ගත කර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් මේ වන විට සකස් කර ඇත. මෙම කටයුතු ප්‍රධාන කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු හා ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු විසින් අධීක්ෂණය කරනු ලැබේ. මේ වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දත්ත පද්ධති 03ක් පවත්වාගෙන යන අතර මෙම සියළු ක්‍රියාකාරකම් හා දත්තයන් ඇතුලත් එක් දත්ත පද්ධතියක් සහිත මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. | වාහන ලියාපදිංචි කිරීමේ සහතිකපත්, ආදායම් බලපත්‍ර, රක්ෂණ කටයුතු ආදී කාර්යයන් නිලධාරියෙකුට නිශ්චිතව පවරා දී වාහන සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවීම් ක්‍රියාවලිය | | |
| (i) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල අනුගමනය කරන ගෙවීම් පටිපාටිය රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූල නොවන බැවින් මෙම පටිපාටිය නිවැරදි කරන ලෙස 2016 සැප්තැම්බර් 22 ලබාදුන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝග කර තිබුණද ගිණුම් කාරක සභා නියෝගයට නොසලකා 2017 අප්‍රේල් 07 දිනැති අංක 2013/31 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර තිබු ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් ගණකාධිකාරිවරයෙකු විසින් ඉටු කල යුතු කාර්යන් වන ගෙවීම් සහතික කිරීම, මුදලින් කරන සියලු ගෙවීම් කිරීම, දෙවැනි අත්සන්කරු වශයෙන් චෙක්පත් අත්සන් කිරීම, සුලු මුදල් පොත හා ගෙවීම් මුදල් | 2011 මාර්තු මස 24 වන දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයද සලකා බලමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගෙවීම් සිදුකිරීමේ ක්‍රියාපටිපාටිය විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මගින් සිදුකරන ගෙවීම් සඳහා වන වවුචර්පත්හි වියදම සහතික ඉංජිනේරු සහකාර සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් වන කොට්ඨාශ සහකාර මගින් සිදුකිරීමට කටයුතු කර ඇත.<br>ඒ අනුව 2013 අප්‍රේල් 07 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර යේ පලකරන ලද අංක 2013/31 දරණ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ සංග්‍රහයේ 6.1 වගන්තිය මගින් අදාල | ගණකාධිකාරිවරයෙකු විසින් ඉටු කල යුතු කාර්යන් ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් ඉවත්කර, ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳ උපයෝගී ලේඛන නඩත්තු කිරීම යන කාර්යයන් ඉංජිනේරු සහකාර සේවයේ විශේෂ ශ්‍රේණියේ කොට්ඨාශ සහකාරගේ රාජකාරි ලෙස දක්වා තිබුණි. | වියදම් සහතික කිරිමට නෛතික ප්‍රතිපාදන ද ලබා දී ඇති බවද වැඩිදුරටත් තහවුරු කරමි. | |
| (ii) | ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාල මගින් සිදුකරන ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්තයන්ට අදාල ගෙවීම් වලින් සියයට 90 කට වැඩි ප්‍රමාණයක ගෙවීම් සහතික කිරීම ගණකාධිකාරිවරුන් හට පවරා නොතිබුණි. | වියදම් සහතික කිරීමේ ක්‍රියාවලිය සදහා ගණකාධිකාරීන් බඳවා ගෙන ඉදිරි කටයුතු කරන ලෙස 2016 සැප්තැම්බර් 22 පැවති ගිණුම් කාරක සභා රැස්වීමේදී නියෝග කර ඇත. ඒ අනුව අදාළ බඳවා ගැනීම් අනුමත කරගැනීම සඳහා කටයුතු කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කල නොහැකි බව දන්වා ඇත. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල ගෙවීම් සහතික කිරීමට නියෝග ප්‍රකාර වීධිමත් ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. |
| (iii) | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල ඉදිකිරීම් කර්මාන්තවල ද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී ගෙවීම් වවුචර්පත්වල ගොණු සම්බන්ධතාව යටතේ ගිවිසුම් අංක පමණක් දක්වා ඇති අතර කිසිදු උපයෝගී ලේඛනයක් ගෙවීම් වවුචර් සමග ඉදිරිපත් කර ද නොතිබුණි. ඒ පිළිබඳ නොසලකා ගෙවීම් අනුමත කර, සහතික කර ගෙවීම් කර තිබුණි. | මෙම කරුණු සම්බන්ධව මාගේ අංක IA/01/COM/04/2022 හා 2023 පෙබරවාරි 15 දිනැති ලිපිය මගින් නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ පිළිබඳව උපදෙස් තරයේ පිළිපැදීමට අවධාරණය කරමින් උපදෙස් ලබාදුනිමි. | ගෙවීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගිවිසුම්ගත කොන්දේසි හා පිරිවිතරයන්ට අනුකූලව වැඩ, භාණ්ඩ හා සේවා සැපයුම්කර ඇති බව හා ඒවා නිවැරදි ලෙස භාර ගෙන ලේඛන ගත කර ඇති බව සනාථ කිරීමට අදාල සියළු ලිපි ලේඛන ගෙවීම් වවුචර් පත් සමග ඉදිරිපත් කළ යුතුය. ගෙවීම් සහතික කරන නිළධාරියා විසින් එම ලේඛන වවුචරය සමඟ ඇති බවට තහවුරු කරගෙන ගෙවීම් සහතික කළ යුතුය. |
| (iv) | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්තයන්ට සපයනු ලබන ද්‍රව්‍ය, භාණ්ඩය හෝ සේවාවට අදාලව සැපයුම් කරු වෙතින් ඉන්වොයිස්පත් ඉදිරිපත් කර නොතිබියදී වවුචර් 402 ක් සඳහා රු. 108,518,811 ක් ගෙවීම් අනුමත කර, සහතික කර ගෙවිම් කර තිබුණි. | මෙම කරුණු සම්බන්ධව මාගේ අංක IA/01/COM/04/2022 හා 2023 පෙබරවාරි 15 දිනැති ලිපිය මගින් නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ පිළිබඳව උපදෙස් තරයේ පිළිපැදීමට අවධාරණය කරමින් උපදෙස් ලබාදුනිමි. | සපයනු ලබන වැඩ, භාණ්ඩය හෝ සේවාවට අදාලව සැපයුම් කරු වෙතින් ලබාගත් ඉන්වොයිස්පත් වව්චර් සමඟ ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | ගෙවීම් කිරීමේදී පොදු 35 ආකෘතිය වෙනුවට වාරිමාර්ග 27 ආකෘතිය මඟින් අවස්ථා 491 කදී රු. 163,729,573 ක් ගෙවා තිබුණි. | මෙම කරුණු සම්බන්ධව මාගේ අංක IA/01/COM/04/2022 හා 2023 පෙබරවාරි 15 දිනැති ලිපිය මගින් නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ පිළිබඳව උපදෙස් තරයේ පිළිපැදීමට අවධාරණය කරමින් උපදෙස් ලබාදුනිමි. | ගෙවීම් කිරීමේදී පොදු 35 ආකෘතිය භාවිතා කළ යුතුය. |
| (ආ) | අනවසර ඉදිකිරීම් හ වගාකිරීම් | | |
| (i) | 1946 අංක 32 දරන වාරිමාර්ග අඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම, ප්‍රධාන ගංගා ද්‍රෝණි, ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වලක්වා ගැනීම, අනවසර ජල භාවිතා කිරීම පාලනය කිරීම හා වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත්කර නොතිබුණි. | මූලික නීතිය වන 285 අධිකාරිය වූ 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 64 වන වගන්තියේ සඳහන් අවශ්‍යතාව සඳහා "Subsidiary Legislation under the Irrigation Ordinance - 1956 Revision" ලෙස රෙගුලාසි පනවා ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වුවද, ඉන් පසුව වාරිමාර්ග ආඥා පනතේ සිදුකළ සංශෝධනයන් හා ශ්‍රී ලංකාවේ සකස් කරන ලද වෙනත් අණ පනත් හා නීතිරීති මඟින්, වාරිමාර්ග ආඥා පනතේ රෙගුලාසි සකස් කළ යුතු බව සඳහන් ක්ෂේත්‍රයන් සියල්ලම පාහේ ආවරණය වන පරිදි නීති සම්පාදනය වී ඇති බැවින්, එකී නෛතික ප්‍රතිපාදන අනුව කටයුතු කරනු ලැබේ. තවද, වාරිමාර්ග රක්ෂිත සීමා සඳහා රෙගුලාසි පැනවීම වාරිමාර්ග අඥාපනත යටතට නොවැටෙන හෙයින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ ප්‍රකාශයට පත්කිරීම සඳහා රෙගුලාසි කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥාපනතේ සඳහන් නියමයන්ට අනුව නෛතික ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ii) | ආඥා පනතේ 65 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 26 කට අයත් වැව් ජලාශ අමුණු ආශ්‍රිත අනවසර ඉදිකිරීම් හෝ වගාකිරීම් 397 ක් හඳුනාගෙන තිබූ නමුත් ඒම අනවසර කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තාකර නොතිබුණි. | චක්‍රලේඛ අංක 08/2014 යනු වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අභ්‍යන්තර උපදෙස් මාලාවන් නිකුත් කරන ලද දෙපාර්තමේන්තු චක්‍රලේඛයකි. එහි සඳහන් කරුණු සහ තාක්ෂණික අවශ්‍යතාවන්ට අනුව, ප්‍රමුඛතාවය සහ පවත්නා මානව, භෞතික හා මූල්‍ය සම්පත්වල සීමාවන්ට යටත්ව, රටේ පවත්නා නීතිය යටතේ වාරි කර්මාන්තවල තිරසර පැවැත්ම ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | වැව් ජලාශ ආශ්‍රිත අනවසර කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 08/2014 දරන චක්‍රලේඛයෙහි 1 හා 3 ඡේද ප්‍රකාරව දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වැව් හා ජලාශ වල රක්ෂිත ප්‍රදේශ සීමා හඳුනාගෙන එහි වපසරිය පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතු වුවද ඇතැම් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලට අයත් වැව්/ජලාශවල වපසරිය සම්බන්ධයෙන් තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය සම්බන්ධයෙන් ක්‍රියා කලයුතු ආකාරය පිළිබඳව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි අංක DI/AM/LL/Leg.Gen/03/01/2023 හා 2024.06.05 දිනැති ලිපිය මඟින් සම්බන්ධිත ආකෘතින් යොමු කර ඇත. | අංක 8/2014 චක්‍රලේඛයේ 1 හා 3 ප්‍රකාරව රක්ෂිත ප්‍රදේශ හඳුනාගත යුතුය. ඒ පිළිබඳ යාවත්කාළීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යායුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ වාරි පද්ධති, සේවකයින්, නිල නිවාස, සංචාරක බංගලා, කාර්යාල ගොඩනැගිලි, වාහන, යන්ත්‍රෝපකරණ යන ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් පාලන, පරිපාලන හා කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය පරිගණක ගත තොරතුරු පද්ධතියක් (Enterprise resource programing system) පවත්වාගෙන ගොස් නොතිබුණි. | ක්ෂේත්‍ර නිලධාරීන් විසින් හඳුනාගනු ලබන අනවසර ඉදිකිරීම් හා අල්ලා ගැනීම් පිළිබඳව විස්තර සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රධාන කාර්යාලය දැනුවත් කරන ලද අවස්ථාවන්හිදී, එම තොරතුරු අමතර පිරිවැයක් නොදරා Google sheet පදනම් කරගෙන සකස් කරන ලද දත්ත පද්ධතියක් ලෙස ඉඩම් හා නීති අංශය විසින් පවත්වා ගනී. විගණන විමසුම මඟින් යෝජනා කර ඇති පරිදි පරිගණක ගත තොරතුරු පද්ධතියක් (Enterprise resource programing system) සකස් වූ විට එකී තොරතුරු යෝග්‍ය පරිදි ඊට ඇතුළත් කිරීමේ හැකියාව පවතී. | දෙපාර්තමේන්තුවේ විවිධ ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් , පරිපාලනය සඳහා කළමණාකරන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයෙන් පිරිනමන වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව සඳහා NVQ 6 මට්ටම අනුමත කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි | වර්තමානයේදී ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය වෙත NVQ 6 මට්ටම ලබා ගැනීමට සියලුම කටයුතු යොදා තිබුනත් එම ආයතනය තුල මේ වන විට අභ්‍යාසලාභීන් කණ්ඩායමක් නොමැති වීම නිසාවෙන් NVQ 6 මට්ටම ලබා ගැනීම ප්‍රමාද වී ඇත.රජයේ තනතුරු සඳහා නව බඳවාගැනීම් සිදුකිරීම රජය විසින් නවතා ඇති බැවින් ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය වෙතද නව අභ්‍යාසලාභීන් කණ්ඩායමක් බඳවාගැනීමට නොහැකි වීම ඊට හේතුව වේ. | ඉංජිනේරු ඩිප්ලෝමාව සඳහා **NVQ – 06** මට්ටම අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2017 ජූලි 18 දිනැති අංක අමප/17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අභ්‍යාස ආයතනයේ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දී තිබූ නමුත් පසුගිය වසර 06 තුලම ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා කිසිවක් පවත්වා නොතිබුණි. | මෙහි සඳහන් පරිදි ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා කිසිවක් පවත්වා නොතිබුණි යන්න හා එකඟ නොවන අතර 2019 වර්ෂයේ ජුනි මස 20 වන දින සිට 29 වන දින දක්වා තායිලන්තයේ රජමංගල විශ්වවිද්‍යාලය සමඟ එක්ව කෘෂිකර්මාන්තය සඳහා ස්මාර්ට් වාරි | ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තාක්ෂණය යන පුහුණු වැඩසටහන පවත්වා ඇත. | |
| (ඊ) | මහඔය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අනුයුක්ත ඉංජිනේරු සහකාරවරයෙකුගේ 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර තිබූ මාසික ද්‍රව්‍ය වාර්තාවේ සඳහන් ද්‍රව්‍ය සම්බන්ධයෙන් කොට්ඨාශ සහකාර හා ගබඩාභාරකරු විසින් සිදු කළ ප්‍රකාශ අනුව එම ද්‍රව්‍ය භෞතිකව නොමැති බව තහවුරු විය. වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය මගින් දෙපාර්තමේන්තුවට අයත් වැඩබිම් වල ඉංජිනේරු සහකාරවරුන් භාරයේ වර්ෂය අවසාන දිනට ඉතිරිව පවතින ද්‍රව්‍ය ශේෂයන් තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023 නොවැම්බර් 24 දින නිකුත් කර තිබූ අංක FIN/ST/VR/2023 දරන ලිපිය අනුව වැඩබිම්වල 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පවතින ද්‍රව්‍ය සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් ඉදිරිපත්කල යුතු වාර්තා තුල මෙම ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | සම්පූර්ණ කරන ලද නියමිත ආකෘති පත්‍ර 2023 වාර්ෂික ගබඩා සමීක්ෂණ වාර්තාවට ඇතුලත් නොකිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ගෙන් විමසා යැවීමට කටයුතු කරමි | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඊට වගකිවයුතු ඉංජිනේරු සහකාර වරයාට සහ භාණ්ඩ සමීක්ෂනය කල නිළදාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළයුතුය. |

## 4. යහපාලනය

### 4.1 ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන මහා පාරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 16 ක් සඳහා රු. මිලියන 80,148 ක් සහ වෙනත් ව්‍යාපෘති **3** ක් සඳහා රු. මිලියන 75,330 ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා 2023 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. මිලියන 64,369 ක් හා රු.මිලියන 1,817 ක් වැයකර තිබුණි.මේ අතරින් ව්‍යාපෘති 17 ක් සඳහා ගණකාධිකාරීවරුන්/ මූල්‍ය නිලධාරින් පත්කර තිබූ නමුත් එකී ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නැත. | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියළුම මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 35 ක් සඳහා නිලධාරින් 437 දෙනෙකු අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේ ඉන් තනතුරු 17 ක කිසිදු නිලධාරියෙකු සේවයේ යෙදී නොතිබුණි. | මෙහි දක්වා ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ කිසිදු නිලධාරියෙකු සේවයේ යෙදී නොමැති තනතුරු 17 අතුරෙන් 2024 පෙබරවාරි 19 වන විට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේත් තනතුරු 04ක් සඳහා බඳවා ගැනීම් සිදුකර ඇති අතර අනෙකුත් තනතුරු රජයේ ප්‍රතිපත්තියට අනුව මේ වන විටත් බඳවා ගැනීම් සිදුකර නොමැති බැවින් තවදුරටත් පුරප්පාඩුව පවතී. | තනතුරු අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනයක් කර එම තනතුරු යටපත්කිරීම හෝ නිළධාරින් බඳවාගැනීම කළ යුතුය. |
| (ආ) | තෘතියික මට්ටමින් තනතුරු 17 ක් සඳහා නිලධාරින් 155 දෙනෙකු අනුමත කර තිබුනද සමාලෝචිත වර්ෂය අවසානයේ ඉන් තනතුරු 11 ක් සඳහා කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොතිබු අතර තෘතියික මට්ටමේ තනතුරු 6 ක් සඳහා නිලධාරින් 28 දෙනෙකුත් පමණක් බඳවාගෙන තිබුණි. | ආයතන සංවර්ධන නිලධාරි තනතුරේ 2023.12.31 වන විට නිලධාරීන් හය දෙනෙකු සේවය කරන අතර කොට්ඨාශ සහකාර තනතුරු වලට බඳවා ගැනීම් සඳහා මේ වන විට කටයුතු සිදුකරමින් පවතී. | අදාල තනතුරු පිළිබඳ සමාලෝචනයක් සිදුකර නිළධාරින් බඳවාගැනීමට කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ද්විතියික මට්ටමේ තනතුරක් වූ සංවර්ධන නිලධාරි තනතුරු සඳහා නිලධාරින් 266 දෙනෙකු පමණක් අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරින් 384 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.ඒ අනුව නිලධාරින් 118 ක අතිරික්තයක් නිරීක්‍ෂණය විය. | ඉතිරි නිලධාරීන් සඳහාද අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් අනුයුක්ත නොකළ යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ සේවයේ නිරතව සිට වැඩ තහනමට ලක්වීම, සේවය හැර යාම,මිය යාම හෝ විශ්‍රාම යාම මත දෙපාර්තමේන්තුවේ සේවය අවසන් කල නිලධාරින් 19 ගේ පෞද්ගලික ලිපිගොනු අස්ථානගත වීම මත එම නිලධාරින්ට හා එම නිලධාරින්ගේ කාලත්‍රයන්ට විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික, වැන්දඹු හා අනත්දරු, විශ්‍රාම වැටුප් ලබාගැනීමට හා රා.ප. චක්‍රලේඛ 14/2019 අනුව වැටුප් විෂමතා මත විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයන් සිදු කර ගැනීමට නොහැකි වී තිබුණි. | මේ සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් පත්කර ඇති අතර කමිටු තීරණය අනුව ඉදිරි කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. තවද ඉදිරියේදී මෙවැනි දේ සිදුනොවීමට වගබලා ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | අස්ථානගත ලිපිගොනු භාර වගකිවයුතු නිළධාරින් සොයාබලා එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටි නිලධාරින් 72 ක් විශ්‍රාම ගොස් තිබූ අතර විශ්‍රාම වැටුප් පිළියෙල කිරිම සඳහා අවශ්‍ය ලියවිලි නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරිම හා නිල නිවාස නැවත රජයට භාර නොදීම යනාදී කරුණු හේතුකොටගෙන නිලධාරින් 23 දෙනෙකුට විශ්‍රාම වැටුප් ලබාගැනීමට නොහැකි වී තිබුණි. | පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම සිදුකරන අතර නිලධාරීන් 23 කගේ පමණක් විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකි වී ඇත. | විශ්‍රාම නිළධාරීන්ගේ තොරතුරු ඉදිරිපත් නොකිරීම හා නිල නිවාස නැවත රජයට භාර නොදීම සම්බන්ධයෙන් විධිමත් පරික්ෂණයක් කර ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිට විශ්‍රාම ගොස් තිබූ නිලධාරින් 4 දෙනෙකු විසින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඔවුන් පදිංචිව සිටි දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස ආපසු භාරදී නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටුකරන ලෙස අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | නිල නිවාස ආපසු භාරදී නොමැති නිළධාරින් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |